# යේසුස් කැදවයි

ඔක්තෝම්බර් 2024



## මා විසින් නුඹ ආරක්ෂාකළේ

නුඹට මාගේ බලය

පෙන්වන පිණිසත් මාගේ නාමය මුළු පොළොවෙහි
ප්‍රකාශවෙන පිණිසත්ය.

නික්මයාම 9:16




# උසස් ස්ථානවලට නැගී යාම

මාගේ අනගි මිතුර,

**යෙසායා 58:14 හි උන්වහන්සේ පොරොන්දු වූ පරිදි දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ ඔබ දේශයේ ජයග්‍රාහී ලෙස උසස් ස්ථානයකට පැමිණ සිටීමය. මම විශ්වාස කරන්නේ මෙම මාසයේදී එම පොරොන්දුව ඉෂ්ට වන්න යන්නේය කියාය. නික්මයාම 9:16 හි ස්වාමීන්වහන්සේ පවසන්නේ "සැබවින් මා විසින් නුඹ ආරක්ෂා කළේ නුඹට මාගේ බලය පෙන්වන පිණිසත් මාගේ නාමය මුළු පොළොවෙහි ප්‍රකාශ වන පිණිසත්ය" කියාය.**

දෙවියන්වහන්සේගේ සැළැස්මෙහි ඔබ අවශ්‍යම කොටසක් වන අතර උන්වහන්සේගේ බලය සම්පූර්ණයෙන් එළිදැක්වීමට ඔබගේ භූමිකාව අත්‍යවශ්‍යය වන්නේය. උන්වහන්සේගේ බලය පෙන්වන පිණිසත් උන්වහන්සේගේ නාමය ඔබ තුළින් මුළු ලෝකය පුරා ප්‍රකාශ වී මහිමවත් වන පිණිසත් ඔබ සිටි ස්ථානයෙන් උන්වහන්සේ ඔබව ඔසවා තිබේ. දෙවියන්වහන්සේ ඔබව පහත්ම තත්ත්වයේ සිට ඉහළටම ඔසවන විට ඔබගේ ජීවිතයේ උන්වහන්සේගේ බලය විද්‍යාමාන වන අතර ඔබගේ ජීවිතය තුළින් එය ලෝකයටද ප්‍රකාශ වන්නේය.

ඔබ අද දිනයේ කුමන බැරෑරුම් තත්ත්වයක සිටියත් ජයග්‍රාහිකයෙක් ලෙස නැගී සිටින්ටත් උන්වහන්සේගේ නාමය මහිමවත් කරන්නත් දෙවියන්වහන්සේට උන්වහන්සේගේ බලයෙන් ඔබව එසවිය හැකිය. එම නිසා බයනොවෙන්න.



"ස්වාමීන්වහන්සේට ප්‍රශංසා කරමින් "ස්වාමීනිය, ඕනෑම තත්ත්වයකින් මාව ඔසවා මා තුළ ඇති ඔබවහන්සේගේ බලය පෙන්වන හෙයින් ඔබවහන්සේට ස්තුතියි" කියා කියන්න.

**අළු මතින් එසවීම**

මාගේ මිතුර, පළමුව දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ ඔබගේ ඉතාම අපහසු සහ බලාපොරොත්තු සුන්වූ තත්ත්වයෙන් (අළුවලින්) ඔබව ඔසවා තැබීමටය. ගීතාවලිය 113 :7-8 දක්වා මෙසේ සඳහන් වන්නේය.

"අධිපතීන් සමග එනම් ස්වකීය සෙනඟගේ අධිපතීන් සමග හිඳුවන පිණිස උන්වහන්සේ දුප්පතා ධූලියෙන් නැගුටුවන සේක. දිළිඳා කසල ගොඩින් ඔසවන සේක".

ඇබ්බැහිවීම්, වැරදි තීරණ, සෞඛ්‍යය ගැටළු, මුදල් ප්‍රශ්න හෝ බිඳුණු සම්බන්ධතා නිසාඔබගේ ජීවිතය විනාශ වී ඇතැයි කියා හෝ අළු මෙන් පහතට වැටී ඇතැයි කියා හෝ ඔබට හැඟෙනවා විය හැකිය. අඛණ්ඩ අසමත් වීම් නිස ඔබගේ සිහින සහ බලාපොරොත්තු ධූලි බවට පත්ව ඇතැයි කියා හෝ ඔබට සිතෙනවාද? කරදර නොවන්න. මක්නිසාද ස්වාමීන්වහන්සේ කියන්නේ උන්වහන්සේ ඔබව අළු මතින් ඔසවන බවයි.

ස්වාමිවූ යේසුස්වහන්සේම මරණය තුළින් ගොස් පොළොවේ ධූලියෙහි වළ දමන ලදී . කෙසේ වෙතත් රෝම 8:11 හි සඳහන් කර ඇති පරිදි ශුද්ධාත්මයාණන් වහන්සේ උන්වහන්සේව ධූලියෙන් නැගිටුවා උන්වහන්සේව නැවත ජීවනයට ගෙන ආ සේක. ඒ ශුද්ධාත්මයාණන් වහන්සේම ඔබ සමගත් සිටින සේක. අද දවසේ ඔබ ඉන්නා තත්ත්වයෙන් උන්වහන්සේ ඔබව ඔසවන සේක.

1 කොරින්ති 6:14 මෙසේ සඳහන් වන්නේයඃ " දෙවියන්වහන්සේ ස්වාමීන්වහන්සේව නැගිටෙවු සේක. අපත් තමන්වහන්සේගේ බලයෙන් නැගුටුවන සේක". ඒ අනුව ඔබත් ඔබගේ දෛනික ජීවිතයේ යේසුස්වහන්සේගේ උත්ථානයේ බලය අත් විඳින්න යන්නේය.

හිතෝපදේශ 24:16 හි බයිබලයේ සඳහන් වන්නේ " මක්නිසාද ධර්මිෂ්ඨයා සත් වරක් වැටුණත් නැගිටින්නේය" යනුවෙනි. ඔබ නැවත නැවතත් ගැඹුරට වැටෙන්න ඇති. එසේත් නැත්නම් ඔබ ධූලියේ සිටිනවා විය හැකිය. නමුත් යේසුස්වහන්සේව ධූලියෙන් ඔසවා නැවත ජීවනයට ගෙන ආ ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබවත් ඔසවමින් නැවත ජීවනයට ගෙන එනවා ඇත.

පාපය ඇතුලුව මරණය ගෙන එන සෑම දෙයක්ම යටත් කරන්න. ඔබගේ ඇබ්බැහිවීම්, දුර්වලකම් සහ කෝපය හෝ ඔබව යේසුස්වහන්සේගෙන් ඉවතට ගෙන යන ඕනෑම දෙයක් යටත් කරන්න. උන්වහන්සේගේ උපකාරය ඉල්ලන්න. "ස්වාමිනී, මට උපකාර කරන්න. මාව ඔසවන්න" කියා කියන්න. ඔබ ධර්මිෂ්ඨයෙක් වූවත් ඔබගේ වේදනාව යේසුස්වහන්සේට යටත් කර උන්වහන්සේගේ උපකාරය ඉල්ලා සිටින්න.

ඔබව නිදහස් කිරීමට සෑම බලයක්ම ඇති ශුද්ධාත්මයාණන් වහන්සේ දැන් ඔබ මතට පැමිණ ඔබව ඔසවන සේක. මම යේසුස්වහන්සේගේ නාමයෙන් මෙම ආශිර්වාදය ඔබ වෙතට එන ලෙසට යාච්ඤා කරමි. ඔබ කොතැනක සිටියත් යේසුස් වහන්සේගේ නාමයෙන් ධූලියෙන් නැගිටින්න.


**අම්රිස්ටාර්හී දීපක් මෙසි මහතාගේ මනහර සාක්ෂිය ඔබ හා බෙදා ගන්නෙමි.**

වසර 5 ක් පුරාම රජයේ රැකියාවකට යාමට දීපක් බොහෝ සෙයින් වෙහෙස විය. ඔහුගේ මිතුරෝ කිහිප දෙනෙක්ටම රජයේ රැකියා ලැබුණි. ඔහුට එසේ නොවීය. මෙයින් ඔහු ලැජ්ජාවට පත්වූ අතර ඔහුගේ ස්ව-විශ්වාසයද බිඳී ගියේය. ඔහුව පරීක්ෂාවට ලක්වූ මෙම වේදනාව මධ්‍යයේ ඔහු විෂාදියට පත් වුනි. රජයේ තනතුරු සඳහා වූ ඇතුල්වීමේ විභාගය ඔහු නිරවුල් කර ගත්තත් ශාරිරික පරීක්ෂණයෙන් ඔහු අසමත් වුනි.

දිනක් කඳු සහිත ප්‍රදේශයකින් නිවස බලා එන අතර තුරදී බලාපොරොත්තු සිඳී යාම නිසා පහළට පැන දිවි නසා ගැනීමට ඔහු කල්පනා කළේය. නමුත් ඒ වෙලාවේදී ඔහුට අපව උත්ථාන කරන යේසුස්වහන්සේගේ හඬ ඇසුණි. "මාගේ පුත්‍රය, දිවිනසා ගන්න එපා. ඔබ වෙනුවෙන් මට මනහර සැළසුමක් තිබේ" කියනවා ඔහුට ඇසුණේය.

උත්ථාන වූ යේසුස්වහන්සේගේ හඬ ඔහුට ඇසුණු කෙණෙහිම මහත් සමාදානයක් ඔහුව වෙළා ගත්තේය. ඔහු නිවසට ගොස් මට විද්‍යුත් තැපැලක් එවූවේය. වහාම එයට පිළිතුරු සපයමින් මම ඔහු වෙනුවෙන් යාච්ඤා කරන බවත් ඔහු මහත් සාර්ථකත්වයක් අත්දකින්න යන බවත් ඔහුට දැන්වූයෙමි.

අලුත් වූ බලාපොරොත්තු සමග දීපක් නැවතත් තරඟකාරී විභාගයන්ට පෙනී සිටියේය. දෙවියන්වහන්සේගේ කරුණාවෙන් ඔහු විභාග හතරක් සමත් වූ අතර රජයේ රැකියා හතරක් ඔහුට පිරිනැමුනි. ඔහු මහත් ප්‍රීතියකින් වෙලී ගියේය. අද දවසේ දීපක් ආදායම් නිලධාරියෙක් මෙන් පංජාබ් රජයේ සේවය කරන්නේය.මොන පුදුමයක්ද! දෙවියන්වහන්සේ ජයග්‍රාහී ලෙස දීපක්ව ධූලියෙන් එසෙවු සේක. උන්වහන්සේ ඒ දෙයම ඔබටත් කර උන්වහන්සේගේ නාමය මහිමවත් කරන සේක. ඔබගේ හදවත කරදර කර නොගන්න.




**අනාගතවක්තෘ කෙනෙක් මෙන් ඔබව ඔසවයි**

ජනතාව අතර අනාගාතවක්තෘ කෙනෙක් මෙන් ඔබව ඔසවන්න දෙවියන්වහන්සේට අවශ්‍යය. දෙවියන් වහන්සේගේ ප්‍රොපේත කෙනෙක් ලෙසට එළිදරව් 19:10 හි සඳහන් වන ලෙසට ඔබ යේසුස්වහන්සේගේ සාක්ෂිය දරනවා ඇත. ද්විතීය කථාව 18:18 හි දෙවියන්වහන්සේ පවසන්නේ "මම ඔවුන්ගේ සහෝදරයන්ගෙන් නුඹ සමාන අනාගත වක්තෘ කෙනෙකු ඔවුන්ට නැගුටුවා දී මාගේ වචන ඔහුගේ මුඛයෙහි තබන්නෙමි" යනුවෙනි. ඔබ උන්වහන්සේගේ වචනය ජනතාව වෙත ගෙන එන අනාගතවක්තෘ කෙනෙක් කිරීමට දෙවියන්වහන්සේ ආසා වන සේක.

එම නිසා, දිරිමත් වන්න. අද ඔබ කැපී පෙනෙන කෙනෙක් නොවන්න පුළුවන. නමුත් අලාභය ගෙන එන සෘණාත්මක වචන ප්‍රකාශ නොකරන්න. ඒ වෙනුවට උන්වහන්සේ ස්වකීය ශුද්ධාත්මයෙන් ඔබව පුරවා අනාගත වාක්‍ය ලෙසට උන්වහන්සේගේ වචනය ප්‍රකාශ කිරීමට ඔබව බලගන්වන එකට දෙවියන්වහන්සේට ස්තුති කරන්න (ක්‍රියා 2:17). විශේෂයෙන් තරුණ අය අනාවැකි කියනවා ඇත.

ඔබ දෙවියන්වහන්සේගේ දරුවෙක් කියා ඔබ ප්‍රකාශ කරන විට ඔබ අනාවැකි කියන්නේය. අද උන්වහන්සේගේ අනාගතවක්තෘ කෙනෙක් ලෙසට ඔබව ඔසවන්න කියා දෙවියන්වහන්සේගෙන් ඒ ආශීර්වාදය ඉල්ලන්න.

**විශ්වාසවන්ත පූජකයෙක් වන්න ඔබව ඔසවයි.**

උන්වහන්සේගේ විශ්වාසවන්ත පූජකයා ලෙස එසවෙන්න දෙවියන්වහන්සේ ඔබව කැඳවන සේක.

1 සාමුවෙල් 2:35 හි ස්වාමීන්වහන්සේ මෙසේ කියන සේක : "මාගේ සිතේද මාගේ කල්පනාවේද හැටියට කරන්නාවූ විශ්වාසවූ පූජකයෙකු මම නැගුටුවා ගෙන ....". ඔබ වෙනුවෙන් වූ දෙවියන්වහන්සේගේ මෙහෙය එයයි.

පූජකයෙක් ලෙසට ඔබගේ භූමිකාව වන්නේ ස්වාමීන්වහන්සේට පූජා ඔප්පු කිරීමත් ජනතාවගේ පාප වෙනුවෙන් සමාව ඉල්ලා යාච්ඤා කිරීමත් වන්නේය. අපගේ පාප වෙනුවෙන් තමන්වහන්සේවම පූජා කරමින් යේසුස්වහන්සේ අපගේ උත්තම පූජකයා වූ සේක. අද දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ ඔබව උන්වහන්සේගේ පූජකයා කිරීමටය.

තෘෂ්ණාවෙන් සහ ලෝකයේ පාප වලින් මිදී ශුද්ධ ජීවිතයක් ගත කරන ලෙසට උන්වහන්සේ ඔබව කැඳවන සේක. එවිට ඔබ තුළින් අනික් අය පව් කමාව ලබා ගන්නවා ඇත. යේසුස්වහන්සේ කියන්නේ ඔබ කෙනෙක්ගේ පාප වලට සමාව දෙන්නේ නම් උන්වහන්සේත් සමාව දෙන බවයි. ශුද්ධවන්තකම සහ ඔබගේ හදවතේ ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමය මගින් ඔබට එවැනි බලයක් සහ ආධිපත්‍යයක් ලැබෙන්නේය. ඔබ උන්වහන්සේගේ විශ්වාසවන්ත පූජකයා වූ විට උන්වහන්සේ ඒකාන්තයෙන්ම ඔබගේ නිවස ගොඩනගා ඔබ වෙනුවෙන් ආරක්ෂිත පදනමක් පිහිටුවන බවට ස්වාමීන්වහන්සේ පොරොන්දු වන සේක.

**දේව සේවකයෙක් වන්න ඔබව ඔසවයි**

දෙවියන්වහන්සේගේ සත්‍යවූ සේවකයෙක් වන්න ස්වාමීන්වහන්සේ ඔබව ඔසවන නිසා ප්‍රීතිවන්න.

යෙසායා 49:6 දෙවියන්වහන්සේ මෙසේ කියන සේක : "..... නුඹ මාගේ සේවකයා වුණාට මදිය. පොළොවේ කෙළවර දක්වා මාගේ ගැළවීම වන පිණිස නුඹ අන්‍ය ජාතීන්ට එළියක් කොටද දෙන්නෙමියි කියන සේක". අඳුරේ සිටින අය මහත් ආලෝකයක් දකිනවා ඇත. යොහන් 8:12 හි යේසුස්වහන්සේ පවසන්නේ "මම ලෝකයේ ආලෝකයය. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ යයි කී සේක" යනුවෙනි.

ඔබ ස්වාමීන්වහන්සේ සමග කිට්ටුවෙන් ගමන් කරමින් ඔබගේ ජීවිතයේ සෑම පියවරකදීම උන්වහන්සේ අනුව ගමන් කරන විට ඔබ තුළ ඇති යේසුස්වහන්සේගේ ආලෝකය ඔබ බබළවන්න පටන් ගන්නා අතර අඳුරේ, බලාපොරොත්තු සුන්වීමෙන් සහ කලකිරීමෙන් සිටින අයට මග පෙන්වනු ලබන්නේය. ඔබගේ ජීවිතයේ සියලු අංශ වලදීද ඔබගේ අධ්‍යාපන කටයුතු වලදීද ඔබගේ පවුල් ජීවිතයේදී හෝ ඔබගේ මූල්‍යමය කටයුතු වලදීද දෙවියන්වහන්සේගේ ආලෝකය ඔබ තුළින් බබළනවා ඇත. අඳුරේ සිටින අන් අයට උපකාර කිරීමට දෙවියන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කිරීමට ඔබ පටන් ගන්නවා ඇත.

ප්‍රිය ස්නේහවන්තය, ඔබව ඔසවා තබන්නත් උන්වහන්සේගේ මහිමය බබළවන්න බලගැන්වීමටත් ක්‍රිස්තුස්වහන්සේගේ ආලෝකය ඔබගේ ආත්මය බබළවන්න සූදානම්ව සිටියි. මෙම අරමුණ සඳහා ස්වාමීන්වහන්සේ ඔබව උන්වහන්සේගේ ශුද්ධාත්මයෙන් පුරවන සේක. 2 කොරින්ති 3:18 හි දැක්වෙන පරිදි ලෝකයේ සත්‍ය ආලෝකය වන ශුද්ධාත්මය මගින් යේසුස්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට අපව වෙනස් කරනු ලබන්නේය.

### රජෙක් වන්න ඔබව ඔසවයි

ස්වාමීන්වහන්සේ ඔබව නායකයෙක් එසේත් නැත්නම් උන්වහන්සේගේ හාස්කම් ජනතාව වෙතට ගෙන එන උන්වහන්සේගේ ආධිපත්‍යයෙන් හැසිරෙන රජෙක්‍යයෙ වීමට තෝරාගෙන ඇත. යෙරෙමියා 30:9 හි බයිබලයේ පවසන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟ වෙනුවෙන් උන්වහන්සේ නායකයන් තෝරා පත් කරන බවයි. අද මම යාච්ඤා කරන්නේ මෙම අනුග්‍රහය ඔබ මත පැමිණ ක්‍රිස්තුස්වහන්සේ ගැන දැනගැනීමෙන් ගැළවීම ලබන පිණිස බොහෝ දෙනෙකුට මග පෙන්වන සහ උන්වහන්සේගේ බලවත් නාමයෙන් හාස්කම් කරන පිණිස මෙම ලෝකයේ ආලෝකය බවට ඔබව පත් කරන ලෙසටයි.

"මට සේවය කරන ජනතාවක් ඇති කිරීම සඳහා මම ඔහුව රජෙක් ලෙසට ඔසවන්නෙමි" කියා ස්වාමීන්වහන්සේ පොරොන්දු වන සේක. රජෙක් ලෙසට ඔබගේ ආත්මික තත්ත්වය දෙවියන්වහන්සේ ඔසවන්නේ යේසුස්වහන්සේගේ නාමයෙන් හාස්කම් කරන පිණිස බලය ලබා දෙමිනි. ඔබ යාච්ඤා කරමින් විශ්වාස කරන කල ඔබ ඉල්ලන කුමන දේ වුවත් ස්වාමීන්වහන්සේ එය ස්ථිර කර හාස්කම් වෙන්න සළස්වන සේක. "එබැවින් නුඹලාට කියමි-නුඹලා යාච්ඤා කොට ඉල්ලන මොන දෙයක් වුවත් ඒ සියල්ල නුඹලාට ලැබුණේයයි අදහාපල්ලා" යයි මාර්ක් 11:24 හි දැක්වෙන්නේය.

මාර්ක් 16:17-18 දක්වා ස්වාමීන්වහන්සේ පවසන්නේ " අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම් ඔව්හු මාගේ නාමයෙන් යක්‍ෂයන් දුරු කරන්නෝය. අන් භාෂාවලින් කථා කරන්නෝය. සර්පයන් අල්ලාගන්නෝය. යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය. ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි ඔව්හු සුවය ලබන්නෝයයි කී සේක" යනුවෙනි. ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ අපට අත්විඳිය හැකි රාජකීය ආධිපත්‍යය මෙයයි. මෙම ආධිපත්‍යය ඇතුව ඔබ යක්‍ෂයන් දුරු කරන්නේය. අන්‍ය භාෂාවලින් කථා කරන්නේය. යේසුස්වහන්සේගේ නාමයෙන් රෝගීන් සුවපත් කරන්නේය. ඔබ කථා කරන වචන පැමිණෙන්නේ රජුන්ගේ රජුගෙනි. ඉහළින් ඔබට ලැබුණු මහත් ආධිපත්‍යයකින් ඔබ එම වචන පිට කරනවා ඇත.

යේසුස්වහන්සේගේ නාමයෙන් හාස්කම් කරන්න රජෙක් ලෙසට ඔසවනු ලැබූ ඔබට දෙවියන්වහන්සේ මෙම බලය ලබා දෙන සේක. ඔබ සහ ඔබගේ දරුවන්ට මෙම පොරොන්දු ව ඉෂ්ට වන පිණිස යේසුස්වහන්සේගේ ශුද්ධාත්මයෙන් ඔබව පුරවන ලෙසට ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලන්න.

### ඔබගේ රෝගයෙන් ඔබව ඔසවයි

අපගේ දෙවියන්වහන්සේ දයානුකම්පාවෙන් යුක්තය. ඔබගේ සහ ඔබගේ පවුලේ ඇති සෑම දුර්වලතාවයක්ම ඉවත් කිරීමට උන්වහන්සේට අවශ්‍ය වන සේක. එසේය. ඔබව රෝගී සයනයෙන් එසවීමට උන්වහන්සේට අවශ්‍යය. රෝම 8:11 හි දැක්වෙන්නේ යේසුස්වහන්සේව මරණින් නැගිටෙවූ ඒ ආත්මයාණන් වහන්සේම ඔබවත් ඔසවන බවයි.

යාකොබ් 5:14-15 හි මෙසේ දැක්වේ : "නුඹලා අතරෙහි යමෙක් රෝගාතුරව සිටින්නේද? ඔහු සභාවේ වැඩිමහල්ලන්ට හඬගසාවා. ඔව්හු ස්වාමීන්වහන්සේගේ නාමයෙන් ඔහුට තෙල් ආලේප කොට ඔහු උදෙසා යාච්ඤා කරත්වා. එවිට ඇදහිල්ලේ යාච්ඤාවෙන් රෝගාතුරයාට සුවය ලැබේ. ස්වාමීන්වහන්සේ ඔහු නැගුටුවනවා ඇත".

අද මම යාච්ඤා කරන්නේ ඔබගේ රෝගයෙන් ඔබ සුව වන පිණිසය. දෙවියන්වහන්සේ රෝගී සයනයෙන් ඔබව නැගුටුවන අතර යේසුස්වහන්සේගේ පහරවලින් ඔබ සුවය ලබන්නේය. එම නිසා යේසුස්වහන්සේගේ බලවත් නාමයෙන් නැගිටින්න. බොකෝරෝහී ජුජනීටා සහෝදරිය සහ ආනම් සහෝදරයාගේ සාක්ෂිය ඔබ හා බෙදා ගන්නෙමි. 2018 දී අසාමාන්‍ය ලෙසින් ආනම් මහතාගේ බර අඩුවන්න පටන් ගත්තේය. ඔහුගේ වෛද්‍ය වාර්තා භයානක විය. ඔහුගේ සුදු රුධිර රක්තානු කැපී පෙනෙන ලෙසින් වැඩිවී තිබුණි.

ඔහුට ලේ පිළිකාවක් විය. පවුල බොහෝ සෙයින් ශෝකයට පත්ව ප්‍රතිකාර සඳහා වහාම ඔහුව රෝහල් ගත කරන ලදී. ඔහුට පිලිකා ප්‍රතිකාර පටන් ගැනීමට පෙර 2018 මැයි 1 වන දින ඔව්හු චෙන්නායි යාච්ඤා කුළුණ වෙත ගියහ.එදින මම පුද්ගලිකව එහි සිටි ජනතාවට යාච්ඤා කරමින් සිටියෙමි. ඔව්හු මා වෙතට ආහ. "ස්වාමීනි, මෙම ලේ පිළිකා තත්ත්වය වෙනස් කර ඔහුව සම්පූර්ණයෙන්ම සුව කළ මැනව" කියා මම යාච්ඤා කළෙමි. යාච්ඤාවෙන් පසුව ඔවුහු බෙතෙස්ඩා යාච්ඤා කුළුණ වෙත ගිය අතර යේසුස්වහන්සේ සමග කිසිදු සබඳතාවක් නොතිබුණු ආනම් මහත් තම පුද්ගලික ගැළවුම්කරුවාණන් ලෙස යේසුස්වහන්සේව පිළිගෙන ඔහුගේ හදවත උන්වහන්සේට කැප කළේය.

ස්වාමීන්වහන්සේ ඔබටත් ඒ දෙයම කරන සේක. දෙවියන්වහන්සේ මෙම මාසය පුරාවටම ඔබව මෙම ආශිර්වාද වලින් ආශිර්වාද කරමින් ආත්මිකව සහ භෞතිකව ඔබව උසස් ස්ථානවලට ගෙන යන සේක්වා. එයින් උන්වහන්සේගේ නාමය මහිමයට පත් වේවා.

දින දහයකට පසුව ඔවුහු රෝහලට ගියේ පිළිකා ප්‍රතිකාර පටන් ගැනීම සඳහාය. කෙසේ වෙතත් ප්‍රතිකාර පටන් ගැනීමට පෙර තවත් පරීක්‍ෂණයක් කරන ලදී. සියලු දෙනාගේම පුදුමයට මෙන් සුදු රුධිර රක්තානු සම්පූර්ණයෙන්ම ස්වභාවික තත්ත්වයේ තිබුණි. වෛද්‍යවරු ප්‍රතිකාර නවත්වා ඔහු නිරෝගී බව පැවසූහ. අද එයින් වසර හයකට පසුව ආනම් මහතා සම්පූර්ණ සුවයෙන් සිටියි. පිළිකාවක ලකුණක්වත් නොමැත. පවුලක් වශයෙන් ඔව්හු දැන් අන් අය උදෙසා යාච්ඤා කරති. යේසුස්වහන්සේ ඔවුන් තුළින් අන් අයව සුවපත් කිරීම අඛණ්ඩව කර ගෙන යන සේක.

# දේව භක්තියෙන් යුත් පවුලක් ඇති කිරීම

ප්‍රිය මිතුර,
මෙම මාසය සඳහා දෙවියන්වහන්සේගේ
පොරොන්දුව එන්නේ යෙරෙමියා 32:39 නි.

**"ඔවුන්ටත් ඔවුන්ට පසු ඔවුන්ගේ දරුවන්ටත් ශුභසිද්ධ වන පිණිස සෑම කල්හිම මා කෙරෙහි භයවීමට එක සිතක්ද එක මාර්ගයක්ද ඔවුන්ට දෙන්නෙමි".**



මෙම පදයේ පොරොන්දු වී ඇති ලෙසට ස්වාමීන්වහන්සේ අපට පැහැදිළි සහ අවධානයෙන් යුත් හදවතක් සහ අරමුණක් ලබා දෙන්නේ අපි උන්වහන්සේට සෑම විටම ගරු කරන පිණිස සහ අපටත් අපගෙන් පසුව අපගේ දරුවන්ටත් යහපත් කාලයක් උදාවන පිණිසත්ය.

අපගේ සිතුවිලි සහ ක්‍රියාවන් එක්සත් වීම සහ විනිවිද භාවයෙන් යුතු වීම වැදගත් වන්නේය. ඒ අප හා දෙවියන්වහන්සේ අතර ඇති ගිවිසුමට පමණක් නොව විවාහයද ඇතුළත්ව අන් අය හා සමග අපගේ ඇති සම්බන්ධතාවයන් වලදීද වේ. මෙම එක්සත්කම සහ එකීය මනසක් තිබීම දේව භක්තියෙන් යුත් පවුලක් ගොඩ නැගීමට වෙර දරණ පවුල්වල විශාල බලපෑමක් ඇති කරන්නේය.

විවාහයේදී එක්සිත් වීම ඇත්තෙන්ම වැදගත් වන්නේ ජනතාව එකිනෙකාට කිට්ටුවෙන් සිටීම දෙවියන්වහන්සේ ප්‍රිය කරන හෙයිනි. නිදසුනක් වශයෙන් උත්පත්ති 2:24 හි සඳහන් වන්නේ ස්ත්‍රියක් සහ පුරුෂයෙක් විවාහ වීමේදී ඔවුන් එක් අයෙක් වන බවයි. මෙය භෞතිකව පමණක් නොවේ හැඟීමෙන්ද ආත්මයෙන් සහ බුද්ධිවිෂයෙහිද විය යුතුය. ස්වාමිපුරුෂයෙක් සහ ස්ත්‍රීයක් එකට වැඩකරන විට තමන්ගේ අරමුණු ඇගයීම් සහ හැසිරීම් දෙවියන්වහන්සේට ගරුකරන ආකාරයෙන් දරුවන් හදා වඩා ගැනීමට ශක්තිමත් අඩිතාලමක් ඇති කරනවා ඇත.
එපීස 4:2-3 දක්වා පැවසෙන්නේ යටහත්කමින්ද මොළොක් ගුණයෙන්ද ඉවසිලිවන්තකමින්ද හැසිර සමාදානයේ බැම්මෙන් ආත්මයාණන්ගේ එකමුතුකම පවත්වා ගෙන යෑමටය. වෙනත් වචන වලින් කියනවා නම් එයින් අදහස් වන්නේ මෙම ගුණාංග දෙවියන්වහන්සේගේ මාර්ගයන් අනුව යන්න පවුලකට ඇත්ත වශයෙන්ම උපකාරී වන යහපත් සහ නිරෝගී සම්බන්ධතාවයන් බවයි.
තම පවුල වෙනුවෙන් දෙමාපියන් දෙදෙනාම එකම දර්ශනයක සිටින්නේ නම් එය ඔවුන්ගේ දෙමාපිය වගකීමටද තීරණ ගැනීමටද මුළු පවුල් ජීවිතයටමද බලපෑමක් ඇති කරන්නේය.

බයිබලයේ හිතෝපදේශ 16:3 හි දැක්වෙන්නේ ඔබ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නේ නම් ඔබගේ යෝජනා සාර්ථක වන්න උන්වහන්සේ ඔබට උපකාර කරන බවයි. එසේ හෙයින් දෙවියන්වහන්සේගේ සැළසුම්

හා යුවළකගේ සැළසුම් සමාන්තර වන්නේ නම් යහපත් කිතුනු ඇගයීම් සමග දරුවන් ඇති දැඩි කරන්න එය ඔවුන්ට උපකාර වන්නේය.

**පසුගිය වසර තිහ පුරා බෙතෙස්තා යාච්ඤා මධ්‍යස්ථානයේ සේවයට දෙවියන් වහන්සේ දුන් ඇදහිය නොහැකි සහයෝගයට ස්තුති කිරීමට කරුණාකර මා හා එක්වන්න**

නිදසුනක් වශයෙන් තම දරුවන් බයිබලයට ප්‍රේම කරන්නන් වනවාටද බයිබලයට ප්‍රේම කිරීම ඇතුලුව ඔවුන්ගේ දෛනික වැඩ වලදී එකට බයිබලය කියවීම ඔවුන්ගේ ඇදහිල්ල ගැන කථා කිරීම සහ සහාවේදී ක්‍රියාකාරී සාමාජිකයන් වීම වැනි දේ තම දරුවන් කරනවා දකින්න දෙමාපියන් කැමති වෙති. මේවා නිතරම කිරීමෙන් දරුවන් මෙම අගයන් ඉගෙන ගෙන ඔවුන් සඳහා ශක්තිමත් ආත්මික වටපිටාවක් සාදා ගනිති.

එක්සිත්ව හිඳිමින් එකම අරමුණක් ඇතුව සිට සාර්ථක ලෙස ශක්තිමත් ප්‍රේමණීය පවුලක් ගොඩ නැගූ පවුලක් ගැන දිරිගැන්වෙන උදාහරණයක් බෙදා ගන්න කැමැත්තෙමි. ජෝන් සහ ලීසා විවාහ වී වසර විස්සකි. දරුවන් හදා වඩා ගැනීමේදී ඔව්හු බොහෝ අභියෝගයන්ට මුහුණ දුන්හ. ඔවුන් දෙදෙනාටම අවධානග්‍රාහී වෘත්තීන් තිබූ අතර දෙමාපිය චාරිත්‍ර ගැන වෙනස් අදහස් තිබුණි. මෙය සමහර විට දරුවන් අතර ව්‍යාකූල භාවයක් ඇති කළේය.

එකට වැඩ කිරීමේ අවශ්‍යතාවය තේරුම්ගත් ජෝන් සහ ලීසා තමන්ගේ දෙමාපියකරණ අරමුණු සහ පුහුණු වීම් සමාන්තර කර ගැනීමට තීරණය කළහ. ඔව්හු තමන්ගේ අගයන් එළිපිටම කථා කරන්න පටන් ගත්හ. එනම් දරුවන් වෙනුවෙන් තමන්ට අවශ්‍ය දේවල් සහ එකිනෙකාට උපකාර කර ගන්නේ කෙසේද යන්න ගැන. ඔවුන් දෙදෙනාටම අවශ්‍ය වූයේ දරුවන් කිතුනු ඇදහිල්ලේ ශක්තිමත් අඩිතාලමක් මත හදා වඩා ගැනීමටය. එම නිසා ඔවුහු නිතරම සභාවට යන්නත් එකට යාච්ඤාකරන්නත් දේව වචනය මත පදනම්ව තම ඇදහිල්ල ගැන දරුවන්ට උගන්වන්නත් කැප වූහ.

ඔවුන් කළ එක වැදගත් වෙනසක් වන්නේ සෑම සවසකම පවුලේ නමස්කාර වෙලාවක් වෙන් කර ගැනීමයි. මෙම පුරුද්ද ඔවුන්ගේ පවුල් ජීවිතයේ අඩිතාලම වූ අතර එය ඉගැන්වීම සාකච්ඡා කිරීම සහ බැඳීමක් ඇති කර ගැනීම සපුරාලූයේය. තම දරුවන්ගේ විනය සම්බන්ධයෙන් එකම අදහසක් පෙන්වීමට ඔවුහු මහත් උත්සාහයක් දැරූහ. ජෝන් සහ ලීසාගේ සමගිය සහ එකම මනස තබා ගැනීමේ උත්සාහය ඵල දැරීය. ඔවුන්ගේ දරුවන් තම ඇදහිල්ල ගැන පැහැදිලි අවබෝධයකින් වර්ධනය වූහ. එසේම දෙවියන්වහන්සේගේ මූල ධර්ම අනුව ජීවත් වීමේ වැදගත්කම ඔවුහු තේරුම් ගත්හ. විවාහයේදී සහ දරුවන් හදා වඩා ගැනීමේදී එකම අරමුණකින් සිටීම ගැන ඔවුන් දැක්වූ කැපවීම ඔවුන්ගේ පවුලට ශක්තිමත් ආත්මික අඩිතාලමක් සැපයුවේය.

ස්නේහවන්තයිනි, සෑම විටම ශක්තිමත් සහ අනුමත විවාහයක් පවත්වා ගෙන යාම පහසු නොවේ. සමහර විට අපගේ වෙනස්කම් ගැටීම් ඇති කළ හැකිය. නමුත් යහපත සඳහා දිගටම කටයුතු කිරීම වැදගත් වන්නේය. රෝම 15:5 අපව දිරිගන්වන්නේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කළාක් මෙන් එක්සිත්ව සිටීමට දෙවියන්වහන්සේගෙන් උපකාර ඉල්ලා සිටින ලෙසය

පවුල්වල එක්සත් බව හා යහපත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය වන්නේ සංනිවේදනය, එකිනෙකාට ගරු කිරීම සහ එකඟතාවයට පැමිණීමට ඇති කැමැත්ත වන්නේය.

එසේම දෙවියන්වහන්සේට ප්‍රමුඛස්ථානය ලබා දීමටද අමතක නොකරන්න. උන්වහන්සේ සමග ශක්තිමත් ආත්මික සම්බන්ධතාවයක් පවතී නම් එය එකිනෙකා හා සම්බන්ධතාවය ශක්තිමත් කරනවා ඇත. යෙරෙමියා 32:39 කථා කරන්නේ පවුල් එකම අරමුණකින් සහ අගයන්ගෙන් සමගිව සිටීමේ වැදගත් කම ගැනය. එයින් අදහස් වන්නේ දරුවන් ඇති පවුල්වල දරුවන්ට සරිලන වාතාවරණයක් ඇති කිරීමට කටයුතු කිරීමයි. යුවලක් එකම දර්ශනය බෙදා ගන්නේ නම් සහ එකිනෙකා නඩත්තු කර ගන්නේ නම් සහ දරුවන් රැක බලා ගැනීමට එකිනෙකාට උපකාර කර ගන්නේ නම් ඔවුන්ට ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් ඇදහිල්ලේ සහ චරිතයේ ශක්තිමත් අඩිතාලමක් ඇති කළ හැකිය.

එක්සත්කමට සහ එක් මනසකින් යුක්තවීම කෙතරම් වෙනසක් ඇති කරන්නේදැයි යන්නට හොඳම නිදසුන ජෝන් සහ ලීසාගේ පවුලයි. ඔව්හු ඔවුන්ගේ අගයන් සහ ඇදහිල්ල බෙදා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම දෙමාපියකරණය සමග සමාන්තර කර ගත්හ. එය ඔවුන්ගේ විවාහය ශක්තිමත් කළා පමණක් නොව ඔවුන්ගේ දරුවන් ආත්මිකව ශක්තිමත්ව වැඩීමටද උපකාර කළේය. යුවළක් ඔවුන්ගේ විවාහයේදී එකට කටයුතු කරද්දී දෙවියන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කර මග පෙන්වාවියයි විශ්වාස කළ හැකිය. ඒ අනුව උන්වහන්සේට ගරුකරන පවල් ජීවිතයක් ගත කිරීමට උන්වහන්සේ ඔවුන්ට උපකාර කරන සේක.

**උන්වහන්සේට ගරු කරන පවුලක් තැනීමට දෙවියන්වහන්සේ ඔබ දෙදෙනාටත් අනුග්‍රහය ලබා දෙන සේක්වා.**

සේවයේ මාගේ ප්‍රේමණීය කොටස්කරුව
ශුභාරංචිය ප්‍රචලිත කිරීමේ ගමන ගැන බලද්දී නික්මයාම
9:16 හි දැක්වෙන බලවත් වචන මට සිහිපත් වූයේය. "
සැබවින් මා විසින් නුඹ ආරක්ෂා කළේ නුඹට මාගේ බලය
පෙන්වන පිණිසත් මාගේ නාමය
මුළු පොළොවෙහි ප්‍රකාශවන පිණිසත්ය".



# මාගේ හදවත පත්ලෙන් මම කථා කරමි......

මෙම අරමුණ සිතෙහි දරා ගෙන ඔබ සේවයෙහි රඟදක්වන වැදගත් භූමිකාව පිළිගෙන මම මෙය ඔබට ලියමි. ඔබගේ කැප වීම සහ උපකාරය අපගේ සේවයට බොහෝ සෙයින් වැදගත් වන්නේය. අපි එක්ව උන්වහන්සේ විසින් අපට පවරා ඇති උන්වහන්සේගේ දූතනය පොළොවේ සෑම කොණකටම ගෙන යමින් උන්වහන්සේගේ නාමය ප්‍රකාශ කිරීම සඳහා වූ දෙවියන්වහන්සේගේ මහත් සැළසුමේ අපි පංගුකාරයන් වන්නෙමු.

මෙම මාසයේදී මහත් සෙයින් උන්වහන්සේගේ අරමුණ ඔබ තු ළින් ඉෂ්ට කර ගෙන බොහෝ අය ක්‍රිස්තුස් වහන්සේගේ මහිමය වෙත ගෙන ඒමට කටයුතු කරන ආකාරය මම මහත් බලාපොරොත්තුවෙන් බලා සිටිමි.
අපි ඔබගේ කොටස්කාරත්වය ඉතා අගය කරමු. අපගේ සේවයටද ඔබගේ යාච්ඤා සහ උපකාරය මගින් තවත් මිලියන ගණනකටද ඔබ දිගටම ආශිර්වාදයේ ආලෝකයක් වන බවට මට ස්ථිරය.
සේවයේ මෑතකදී සිදුවූ දේවල් ගැන ඔබ හා බෙදා ගන්නට කැමැත්තෙමි.

**ප්‍රශංසා වාර්තාව**

- 2024 අගෝස්තු මස 25 වන දින පැවැත්වූ පොඩුචෙරි ආශීර්වාද රැස්වීම ඉතා සාර්ථක වූ අතර දෙවියන්වහන්සේගෙන් මහත් දේ බලාපොරොත්තුවෙන් බොහෝ දෙනෙක් රැස්වූ එකක් වුනි. මගේ පුත්‍රයා වන සැමුවෙල් දිනකරන් දේව වචනය බෙදා ගත්තේය. එසේම පැමිණ සිටි අය වෙනුවෙන් ඉතා උනන්දුවෙන් යාච්ඤා කළේය. මනුෂ්‍යයන් මධ්‍යයේ ස්වාමීන්වහන්සේ බලවත් ලෙස ක්‍රියා කළ අතර බොහෝ දෙනෙක් උන්වහන්සේගේ අද්විතීය ස්පර්ශය අත්වින්දහ.

- මම ඉරුදින දේව මෙහෙයේ දේව වචනය බෙදා ගත්තෙමි. එසේම දෙවියන්වහන්සේ අපට පෙරටුවගමන් කරන ආකාරය සහ උන්වහන්සේගේ අභිමුඛය අපගේ ජීවිත ඔසවන ආකාරයද බෙදා ගත්තෙමි.

- වනග්‍රම්හී මාසික හාස්කම් යාච්ඤාව බොහෝ දෙනක්ගේ ජීවිත වලට හාස්කමක් වූයේය. 14 වන දින පැවැත්වූ නිරාහාර යාච්ඤාව බොහෝ සෙයින් සාර්ථක විය. නිරාහාරයෙන් යුතුව ස්වාමීන්වහන්සේ සොයමින් බොහෝ දෙනෙක් පැමිණියහ. මගේ භාර්යයාව වන ඉවැන්ජලීන් පෝල් දිනකරන් බෙදා ගත් අනාවැකි පණිවුඩය පැමිණ සිටින අයට මහත් බලපෑමක් ඇති කළේය. ඒ මගින් දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ට සේවය කරමින් ඔවුන්ගේ ජීවිත වල හාස්කම් සිදු කළ සේක. දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා මෙම නිරාහාර යාච්ඤාව බොහෝ සාක්ෂි ගෙන ආවේය.

- යාච්ඤා සහ අනාවැකි බලගැන්වීමේ" සය මාසයේ සහතික පත් පාඨමාලාවේ ඊළඟ කණ්ඩායම අගෝස්තු 28 වන දින ආරම්භ වූ අතර දැනට කෙරීගෙන යන්නේය. 97 දෙනෙක් පමණ දැනට ලියා පදිංචිව ඇත. ස්වාමීන්වහන්සේට සේවය කිරීම ගැන ඔවුහු දැනට පුහුණුව ලබති. මෙම පුහුණුවේ අරමුණ වන්නේ දෙවියන්වහන්සේගේ බලයෙන් අන් අය සමග දෙවියන්වහන්සේගේ ප්‍රේමය බෙදා ගැනීමය. අපගේ අනගි කොටස්කරුවන් පුහුණු කිරීමද ඔවුන්ගේ ජීවිතවල ආත්මික දීමනා ක්‍රියාත්මක වීම ගැන යාච්ඤා කිරීමද ඉදිරි දිනවල දෙවියන්වහන්සේ බලවත් ලෙසින් ඔවුන්ව පාවිච්චි කරන බවට ඔවුන් දිරිගැන්වීමටද අපට ලැබුණු අවස්ථාව ගැන සන්තෝෂ වන්නෙමු.

- සැප්තැම්බර් 1 වන දින පවුලක් වශයෙන් අපි වෙන්නාහි ඉවැන්ජලිකල් සභාවේ එකතු වූයේ නමස්කාර කාලයක් සඳහාය. පැමිණ සිටි අය බලවත් ලෙසින් ආශිර්වාද ලැබූ දේව වචනය මමත් මගේ භාර්යයාවත් බෙදා ගත්තෙමු. ඉන්පසුව රැස්ව සිටි සෙනඟගේ රැකියාවන් ව්‍යාපාරයන් සහ ඔවුන්ගේ අත් වැඩ ගැන ඔවුන්ට ඇති අවශ්‍යතාවයන් සඳහා මගේ පුතා වන සැමුවෙල් දිනකරන් බලවත් යාච්ඤාවක් ඔප්පු කරමින් උන්වහන්සේගේ අනුග්‍රහයෙන් ඔවුන්ව ඔසවන ලෙසට යාච්ඤා කළේය.

**යාච්ඤා ඉල්ලීම්**

යේසුස් කැඳවයි වෙබ් අඩවිය සහ මෘදුකාංග වර්ධනයට

"නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා" (මාර්ක් 16:15).

යේසුස් කැඳවයි සේවයේ වෙබ් අඩවි සහ මෘදුකාංග වර්ධනය සඳහා යාච්ඤා කරන්න. එසේම 2025 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන්න යන "ඉමැනුවෙල් ඩිජිටල් ව්‍යාපෘතිය" ගැනද යාච්ඤා කරන්න.

**පසුගිය වසර තිහ පුරා බෙතෙස්තා යාච්ඤා මධ්‍යස්ථානයේ සේවයට දෙවියන් වහන්සේ දුන් ඇදහිය නොහැකි සහයෝගයට ස්තුති කිරීමට කරුණාකර මා හා එක්වන්න**

**මහත් දක්ෂතාවයන්ගෙන් යුත් වෘත්තිකයන් ඇති කිරීම**

"ඉදින් නුඹලා සියලු දෙයින් එනම් ඇදහිල්ලෙන්ද කථාවෙන්ද ඥානයෙන්ද සියලු උත්සාහවලින්ද. අධිකව සිටින්නාක් මෙන්ම මෙම අනුග්‍රහයෙන්ද අධිකවන්ට බලාගනිල්ලා" (2 කොරින්ති 8:7).

දක්ෂතාවයන් දක්වන උපාධිධාරීන්ට ආලෝකයක් මෙන් කාරුණ්‍යා විශ්ව විද්‍යාලය බැබළේ. 1 පේත්‍රුස් 2:9 හි දක්වා ඇති පරිදි බලගැන්වෙමින් විශ්ව විද්‍යාලය සිසුනි හැඩ ගස්වන්නේ අධ්‍යාපනයෙන් පමණක් නොවේ ලෝකයටම මග පෙන්විය හැකි ආත්මික අයවළුන් වීමටද වේ.

**දෙවියන්වහන්සේගේ මහිමාන්විත වාසස්ථානය**

"මෙය සදාකල්ම මාගේ නිවාඩු ස්ථානයය. මෙහි වසන්නෙමි. මක්නිසාද ඊට ආශා වීමි" (ගීතාවලිය 132:14).

යාච්ඤා කරන්නත් දෙවියන්වහන්සේට ස්තුති කරන්නත් සොයන අයට මෙතෙස්ඩා යාච්ඤා මධ්‍යස්ථානය රක්ෂස්ථානයකි. එය ආරම්භයේ සිටම ශුද්ධවූ වාතාවරණයක් යටතේ සහනය සහ සැනසීම සොයා එන දහස් ගණන් ජනතාවට අභය භූමියක් වුනි. අද වන විට 7,750,164 දෙනෙක් බෙතෙස්ඩාහි දෙවියන්වහන්සේගේ පුදුමයන් අත්දැක තිබේ. සින්දු විජයන් සහෝදරියගේ සාක්ෂිය බෙදා ගැනීමට කැමැත්තෙමි. ඇයට අවුරුදු හතක් දරුවන් සිටියේ නැත. ඇය සමාජයෙන් බොහෝ ලැජ්ජාවට පත් වූවාය. යුවලක් වශයෙන් ඔවුහු බෙතෙස්ඩා යාච්ඤා මධ්‍යස්ථානයට පැමිණ ස්වාමීන්වහන්සේගේ ආශිර්වාද සඳහා යාච්ඤා කළහ. ඊළඟ මාසයේදීම ඇය ගැබ් ගත් අතර පියකරු දියණියක් ලබා දෙමින් දෙවියන්වහන්සේ ඇගේ ගර්භයට ආශීර්වාද කළ සේක. දෙවියන්වහන්සේට මහිමය වේවා. මෙම මධ්‍යස්ථානයට පැමිණ යාච්ඤා සහාය ලබා ගෙන ඔබටත් ආශීර්වාද ලබා ගත හැකිය.

අපි දැන් බෙතේස්ඩා යාච්ඤා නගරය ඇති කිරීමේ අලුත් ව්‍යාපෘතියක් පටන් ගෙන තිබේ. එයින් තවත් බොහෝ දෙනෙක්ට ඔවුන්ට අවශ්‍ය ආත්මික පෝෂණය ලබා ගත හැකිය

මෙම නව මධ්‍යස්ථානයේ පවුල් වලට නවාතැන් ගත හැකි වන අතර ඔවුන්ට සමාදානයෙන් ස්වාමීන්වහන්සේ සමග සම්බන්ධතාවයක්ද පැවැත්විය හැකි වන්නේය. එයට අමතරව දරුවන්ව ප්‍රීතියෙන් තබන්නත් ඔවුන් ගැන සළකා බලන්නත් පහසුකම්ද සැපයෙන අතර එයින් දෙමාපියන්ට ඔවුන්ගේ ආත්මික ගමනට පූර්ණ අවධානය යොමු කළ හැකි වන්නේය.

මෙම බෙතෙස්ඩා යාච්ඤා මධ්‍යස්ථාන සේවයට පසුගිය වසර තිහ පුරාවටම උන්වහන්සේ ලබා දෙන සහයෝගය ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න මා සමග එකතු වන්න. බොහෝ පවුල්වල සහ සමාජයේ මනුෂ්‍ය ජීවිත නගා සිටුවිය හැකි ස්ථානයක් ගොඩ නැගීම සඳහා බෙතෙස්ඩා යාච්ඤා නගරය වෙනුවෙන් නොකඩව යාච්ඤා කරන්න.

**ආශාවෙන් ශුභාරංචිය ප්‍රකාශ කිරීම**

**බොහෝ සමූහයෝ කොරුන්, අන්ධයන්, ගොළුවන්, අබ්බගාතයන් හා වෙනත් බොහෝ දෙනා රැගෙන යේසුස්වහන්සේ ළඟට ඇවිත් උන්වහන්සේගේ පාමුල ඔවුන් තැබුවෝය"**
**(මතෙව් 15:30).**

බස්ටාර් යාච්ඤා සමූළුවට ආශිර්වාද කිරීම පිණිස මමත් මගේ පවුලේ අයත් නොවැම්බර් 8 වන දින සිට 10 වන දින දක්වා ලග්ඩල්පූර් වෙත යන බව දන්වා සිටිමු. එයට අමතරව දෙසැම්බර් 6 සහ 7 යන දිනයන්හි හැරවුම් ලක්ෂයේ ජාතික තරුණ සමූළුව පැවැත්වීමටද අප සූදානම් වන්නෙමු. අපගේ ප්‍රධාන අරමුණ වන්නේ බන්ධනයන්ට සහ ඇබ්බැහිවීම්වලට හසුව සිටින තරුණයන් වෙනුවෙන් යාච්ඤා කිරීමය. මේවාට සහභාගී වන ලෙස ඔබගෙන් ඉල්ලා සිටින්නෙමි.

යේසුස් කැඳවයි ක්‍රියා මාලාවන් නිසා දෙවියන්වහන්සේ බලවත් හාස්කම් කරමින් කොරුන්ට ඇවිදින්න සළස්වමින්ද පිළිකාවන් ක්ෂණයකින් සුවකරමින්ද යක්ෂාවේශවූවන් ගළවා ගනිමින්ද මත්ද්‍රව්‍ය හා මත්පැන්වලට ඇබ්බැහිවූවන් නිදහස් කරමින්ද හාස්කම් කළ සේක. යේසුස් කැඳවයි යාච්ඤා සමුළුවලින්ද ආශිර්වාද රැස්වීම්වලින්ද අද්විතීය හාස්කම්, මිදීම සහ සමාදානය අත්වින්ද මිලියන ගණන් දෙනා වෙනුවෙන් අපි ස්වාමීන්වහන්සේට ප්‍රශංසා කිරීමට මොහොතක් ගනිමු.

කෙසේ වෙතත් සෑම සාර්ථක රැස්වීමකටම හෝ සිද්ධියකට බොහෝ වෙහෙසක් දැරිය යුතු වේ. වේදිකාව සහ පිට්ටනිය සකස් කිරීම, ශබ්ද සහ ආලෝකය, විදුලිය, දැන්වීම්, ආසන යනාදිය සඳහා ලක්ෂ ගණන් වැය කළ යුතු වේ.

මෙම යාච්ඤා රැස්වීම් සඳහා ඔබගේ යාච්ඤාවන් සහ උපකාරයන් අපි බලාපොරොත්තු වෙමු. ඔබගේ සහභාගිත්වය ඒකාන්තයෙන්ම මිලියන ගණනකගේ කඳුළු පිසලීමට උපකාර වන අතර ලොව පුරා ප්‍රීතිය සහ බලාපොරොත්තුව බෙදා හැරීමටද උපකාර වනු ඇත.

**සුවය තුළින් බලාපොරොත්තුව ඇති කිරීම**

“රෝගීන් සුවකරපල්ලා. මළවුන් නැගුටුවාපල්ලා. කුෂ්ට රෝගීන් පවිත්‍රකරපල්ලා. යක්ෂයන් දුරුකරපල්ලා. නුඹලා නොමිළයේ ලැබුවහුය. නොමිළයේ දීපල්ලා” (මතෙව් 10:8).

වරප්‍රසාදයන් අහිමි දහස්ගණනකට වෛද්‍ය පහසුකම් සපයන කාරුණ්‍යා රෝහල ගැන මම දෙවියන් වහන්සේට බොහෝ සෙයින් කෘතඥ වෙමි. අවශ්‍යතාවයන්ගෙන් පෙළෙන අයට නොමිළයේ වෛද්‍ය ප්‍රතිකාර සපයමින් මෙම රෝහල ඔවුන්ට බලාපොරොත්තුවේ ආලෝකයක් ලබා දෙන්නේය. මෙම රෝහලෙන් ප්‍රධාන ශල්‍යකර්මයන් එනම් මුත්‍රාශ ශල්‍යකර්ම, සන්ධි බද්ධ කිරීම, හර්නියා වැනි ශල්‍යකර්මයන් දරා ගත හැකි මිළකට කරනු ලබයි.

මනිකානන්දන් සහෝදරයාගේ සාක්ෂිය ඔහුගේ වචන වලින්ම මෙහි දක්වන්නෙමි. “හුස්ම ගැනීමේ අපහසුතාවයක් නිසා මාව කාරුණ්‍යා රෝහලට ගෙන එන ලදී . මට හුස්ම ගත නොහැකි වූ අතර ජීවිතයත් මරණයත් අතර පොර බදිමින් සිටියෙමි. මෙම රෝහලේ වෛද්‍යවරු වහාම මැදිහත් වී අවශ්‍ය ප්‍රතිකාර ලබා දුන්නේය. දෙවියන්වහන්සේගේ කරුණාවෙන් සහ ලැබුණු හොඳම වෛද්‍ය ප්‍රතිකාර නිසා මගේ ජීවිතය බේරුණි. මාව හදිසි වාට්ටුවට ඇතුල් කරද්දී මට කිසිදු බලාපොරොත්තුවක් නොතිබුණි. නමුත් දැන් මම අලුත් ජීවිතයක් ලබා ඇත්තෙමි”.

මෙම වරප්‍රසාදයෙන් ප්‍රයෝජන ලබා ගන්නා ලෙසට කාරුණ්‍යා අසල සහ ඒ අවට සිටින අයට මම ඇරයුම් කරමි. ඔබටත් මෙම සේවාවන්ට උපකාර කළ හැකිය.

විශේෂ දිනයන්

ඔක්තෝබර් 10 වන දින මගේ පියා ශුද්ධාත්ම ආලේපය ලැබූ අතර එදින යේසුස් කැඳවයි සේවය වෙනුවෙන් දර්ශනයද ලැබුවේය. එතැන් පටන් අපගේ පවුලේ පරම්පරා හතරකට දෙවියන්වහන්සේ මහත්සේ ආශිර්වාද කරමින් අද්විතීය ආත්මික දීමනාවන් ලබා දුන් සේක. අපගේ පවුලේ එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරන ලෙසට ඔබගෙන් ඉල්ලා සිටිමි. ඒ මෙම ආලේපයෙන් ගමන් කරන්නත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් යුතුව බිඳුණු හදවත් ඇති අය වෙනුවෙන් සේවය කරන්නත්ය.

ඉදිරි වැඩ සටහන්

- 2024 ඔක්තෝබර් 2 : වෙන්නාහි නමස්කාර රාත්‍රිය
- 2024 ඔක්තෝබර් 12 : වෙන්නාහි හාස්කම් නිරාහාර යාච්ඤාව
- 2024 නොවැම්බර් 2 : කොයිම්බතූර් විශේෂ ආශිර්වාදිත රැස්වීම
- 2024 නොවැම්බර් 8-10 : බ්ලෙස් බස්ටාඩර් යාච්ඤා සමුළුව
- 2024 දෙසැම්බර් 6-7 : හැරවුම් ලක්ෂයේ තරුණ සම්මේලනය

මෙම වැඩසටහන් වලට ඔබගේ යාච්ඤාව සහ හැකි අයුරින් කරන උපකාරයන් ලැබෙන්න සළස්වන ලෙසට ඉල්ලා සිටිමි.

ප්‍රිය කොටස්කරුව, මේ සැමටම වැඩියෙන් මෙම මාසය පුරාවටම සහ ඉදිරි මාසවලදීත් ඔබ දෙවියන්වහන්සේගේ සියලු යහපත භුක්ති විඳින ලෙසට මම යාච්ඤා කරන්නෙමි. ඒකාන්තයෙන්ම දෙවියන් වහන්සේගේ බහුලවූ ආශිර්වාදයන් ඔබ සහ ඔබගේ පවුලටම ජීවිතයේ සෑම දවස්වලම අත්වේවා.

මගේ හෘදයාංගම ආශිර්වාදයන් සහ යාච්ඤාවන් නිතරම ඔබ සමගයි.

ඔබ වෙනුවෙන් යාච්ඤාකරන ඔබගේ සහෝදර
ආචාර්ය පෝල් දිනකරන්

# ආචාර්ය පෝල් දිනකරන් පිළිතුරු දෙයි....

ප්‍රශ්නය සහ පිළිතුර




මැතිව් තුයිරාන් මහතා මෙසේ අසයි ....

## බව්තිස්මය ගැන බයිබලයේ සඳහන් වන්නේ කුමක්ද? සහ කිතුනු ඇදහිල්ලේ එය මෙතරම් වැදගත් වන්නේ මන්ද?

ක්‍රියා 2:38-39 දක්වා අපෝස්තලු පේත්‍රුස් ප්‍රකාශ කරන්නේ "නුඹලා සියල්ලෝම පසුතැවිලිව පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තිස්මය ලබාපල්ලා" යනුවෙනි. ඒ නිසා බව්තිස්මය යනු සාමාන්‍ය චාරිත්‍රයක් නොවේ. එනම් එය පාපයෙන් ඉවත් වී ඔවුන්ගේ ජීවිත කිස්තුස්වහන්සේට කැප කිරීමට කෙනෙක් ගන්නා ප්‍රසිද්ධ ප්‍රකාශනයකි.

කෙනෙක් තමන්ගේ පාප වලට පසුතැවිලි වන විට ඔවුන්ගේ ඇතුලාන්ත වෙනස් වීමට එය විද්‍යාමාන සහතිකයක් වන්නේය. තමන්ගේ අතීත ජීවිත රටාව එපා කර ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීමට කැප වන බවට කරන ප්‍රසිද්ධ ප්‍රකාශනයකි. රෝම 6:2-3 දක්වාත් කොලොස්සි 2:11-12 දක්වාත් බව්තිස්මය සමාන කරන්නේ මරණයේදී ක්‍රිස්තුස්වහන්සේ සමග මිය ගොස් ධර්මිෂ්ඨකමේ අලුත් ජීවිතයකට නැගිටින බවයි.

කෙනෙක්ව ජලයේ ගිල්වා නැවත පිටතට ගන්නා විට ඔවුන් සංකේතාත්මකව ප්‍රකාශ කරන්නේ "මම පාපය එපාකර ධර්මිෂ්ඨකමේ ජීවිතයකට නැගිටින්නෙමි" කියාය. මාර්ක් 1:9 හි වාර්තා කර ඇති පරිදි අවුරුදු 30 දී යේසුස්වහන්සේ පවා බව්තිස්මය ලැබූ සේක. උන්වහන්සේගේ බව්තිස්මය තුළින් යේසුස්වහන්සේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ ලෝකයේ ආකාරයෙන් ඉවත් වී දෙවියන්වහන්සේ වෙනුවෙන් ජීවත් වීමට ගත් උන්වහන්සේගේ කැපකිරීමය. ඒ ආකාරයටම 8:36-38 දක්වා ඉතියෝපියානු නපුංසකයා ගැන දක්වා ඇති වාර්තාවේ ඔහු පූජාවූ බැටළු පැටවා වන යේසුස්වහන්සේ ගැන පිලිප් කිවු දේ අසා ඔහුගේ පසුතැවිලිවීමේ සහ ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමට ඔහු ගත් තීරණයේ පිටස්තර ලකුණක් ලෙසට බව්තිස්මය වීමට නපුංසකයා තීරණය කළේය.

බව්තිස්මය ඒ අනුව ප්‍රසිද්ධ පසුතැවිල්ලේ බලවත් ක්‍රියාවකි. අන් අය ඉදිරියේ තම සාක්ෂිය දරමින් දේව දරුවන් ලෙස ජීවත් වීමට ඇදහිලිවතුන්ට එය ශක්තියක් වන්නේය.

කෙසේ වෙතත් සමහර කිතුනුවන් ළදරු බව්තිස්මය භාවිතා කරති. ඔව්හු "යමෙක් වතුරෙන්ද ආත්මයාණන් ගෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙන්ට බැරිය" යනුවෙන් යොහන් 3:5 හි යේසුස්වහන්සේ කී දේ අදාළ කර ගනිති. එසේම ඔව්හු මතෙව් 18:3 හි ස්වර්ග රාජ්‍යයට ඇතුල් වීමට කුඩා දරුවෙක් හා සමාන වීමේ වැදගත් කම ගැන යේසුස්වහන්සේ කිවු දෙය අදාළ කර ගනිති. තවත් සමහරු විවාද කරන්නේ පාපය ප්‍රතික්ෂේප කර පුද්ගලික පාපෝච්චාරණයක් කිරීමට තරම් වයසකට එනතුරු බව්තිස්මය ප්‍රමාද කිරීමෙන් ඔවුන් කුඩා කලම මිය ගිය හොත් ඔවුන්ගේ ගැළවීම ගැන අවදානමක් ගන්නා බවටය. එම නිසා දෙමාපියන්ගේ ඇදහිල්ල පදනම් කර ගෙන ඔව්හු ළදරු බව්තිස්මය ගැන විශ්වාස කරති.
ඒ පසුකාලීනව දරුවා යේසුස්වහන්සේ අනුව යන්න ඔහුගේ කැපවීම ස්ථිර කර ගෙන සම්පූර්ණයෙන්ම සභාවට කැප වේය යන බලාපොරොත්තුවෙනි.

තවදුරටත් බයිබලය උපුටා දක්වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව තමන්ගේ ස්වාමින්වහන්සේ සහ ගැළවුම් කරුවාණන් ලෙස පිළිගැනිමේ තීරණය අනුව යාම වඩාත් අර්ථවත් බවයි. ක්‍රියා 2:41 හි පවසන්නේ "ඔහුගේ වචනය පිළිගත් අය බව්තිස්ම කරනු ලැබුවෝය" යනුවෙනි. මෙය බව්තිස්මයේ ප්‍රධාන කරුණ ඉස්මතු කර දක්වයි. එය ඇතුලාන්ත ඇදහිල්ල ගැන පිටස්තර ලකුණ වන්නේය. පාපය එපා කර ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීමට ගන්නා ලද තීරණයයි.

එම නිසා කිතුනු ගමනේදී බව්තිස්මය වැදගත් ලක්ෂණයක් වන්නේය. කෙනෙක් වැඩිහිටියෙක් ලෙසින් හෝ ළදරුවෙක් ලෙසින් හෝ බව්තිස්මය ලැබීමේ ක්‍රියාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය සහ ඉගැන්වීම් පිළිඹිබු කරන ජීවිතයක් ගත කිරීමට මුල් බැස ගත් එකක් වන්නේය. එය ඇදහිල්ලේ පුද්ගලික මෙන්ම ප්‍රසිද්ධ ශුද්ධවූ අවස්ථාවක් විදහා දක්වයි. එසේම ක්‍රිස්තුස්වහන්සේ තුළ නව ආරම්භයක් පෙන්නුම් කරන ශුද්ධවූ අවස්ථාවක් විදහා දක්වයි.

බව්තීස්මයේ ප්‍රධාන අංගය
අභ්‍යන්තර ඇදහිල්ලක
බාහිර ලකුණකි,පාපය අත්හැර
ක්‍රිස්තුස් වහන්සේව
අනුගමනය කිරීමට හිතාමතාම
තෝරා ගැනීමකි

**"එකල ඔහුගේ වචනය පිළිගත් අය බව්තීස්මකරනු ලැබුවෝය. ඒ දවසේදී තුන් දාහක් පමණ මනුෂ්‍යයෝ ඔවුන්ට එකතුකරනලද්දෝය." ක්‍රියා 2:41**

විශ්වාසවන්ත

# හදවතක්

- සැමුවෙල් දිනකරන්



තරුණ පිටුව

මාගේ මිතුරර, උසස් ලෙස අප අල්ලා ගත යුතු දෙයක් වන්නේ හදවෙත් විශ්වාසනීය භාවයයි.

ගේ මිතුරර, උසස් ලෙස අප අල්ලා ගත යුතු දෙයක් වන්නේ හදවෙත් විශ්වාසනීය භාවයයි. අපෝස්තලු පාවුල්ට ස්වාමීන්වහන්සේ උපකාර කළ ලෙසින් අපටත් විශ්වාසනීය හදවතක් ලබා ගැනීමට උන්වහන්සේ උපකාර කරන සේක. 2 කොරින්ති 1:12 හි පාවුල් සහතික කරන්නේ " මක්නිසාද අපේ පාරට්ටුව නම් අපි වනාහි ලෝකයෙහිද විශේෂයෙන් නුඹලා කෙරෙහිද දිව්‍ය වූ ශුද්ධකමින් හා අවංකකමින් මාංසික ප්‍රඥාවෙන් නොව දෙවියන්වහන්සේගේ කරුණාවෙන් හැසුරුණෙමුව යන අපේ හෘදයසාක්ෂයය" යනුවෙනි. දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ උපකාරයෙන් අපගේ සෑම ගනුදෙනුවකදීම සම්පූර්ණ අවංකකමින් අපට ක්‍රියා කළ හැකි බවට මෙයින් සහතික වන්නේය.අවංකකම සොයා යාම අභියෝගාත්මක විය හැකිය. බොහෝ විට අවංකව ජීවත් වීම ගැන ජනතාව අපට උසුළු විසුළු තරති.

ඔවුහු අපට උවමනාවටත් වඩා ධර්මිෂ්ඨයයි කියා හෝ බොළඳ යයි කියා හෝ කිව හැකිය. මෙවැනි ප්‍රතික්‍රියාවන් පැන නගින්නේ අඩු දේ පිළිගැනීමට ලෝකය බොහෝ විට අරගල කරන හෙයිනි. එසේ වූවත් මෙය අපට බාධා කළ යුතු නැත. අවංකකම අපව දෙවියන්වහන්සේ වෙතට ළංකරන බවත් එයි උන්වහන්සේගේ නාමයට ගෞරවය ගෙන එන බවත් දැන ගෙන අපි ස්ථිරව සිටිය යුතු වන්නෙමු.

විශේෂයෙන් තරුණ වයසේදී අපි අවංක විය යුතු විය යුතු යයි බලාපොරොත්තු වන්නේ කුමන රාජකාරීන් වලටද? හොඳින් ඉගෙන ගන්න, තරඟවලදී දක්ෂතා පෙන්වන්න, අපගේ තලෙන්ත උපරිමයෙන් භාවිතා කරන්න අපෙන් බලාපොරොත්තු වන දේවල්ය. එසේම අපගේ පවුලට බොහෝ සෙයින් ප්‍රේම කරන්නත් යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අනුව යමින් දෙවියන්වහන්සේගේ යහපත් පුත්‍රයන් සහ දූවරුන් වන්නත් අපි උත්සාහ කළ යුතු වන්නෙමු. අපගේ රාජකාරී වන්නේ මේවාය. එසේම මේ සැම දෙයකදීම අවංක වීම දෙවියන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන සේක.



අපි මේ සඳහා කැප වන විට එය ඒකාන්තයෙන්ම අපගේ ජීවිතවලට සාර්ථකත්වය සහ ආශීර්වාද ගෙන එනවා ඇත. ස්වාමීන්වහන්සේ අප කෙරෙහි පැහැදී "යහපත්වූ විශ්වාසවූ මාගේ දරුව, ඒ යහපත. ඔබගේ රාජකාරී ගැන නුඹ විශ්වාස වූවෙහිය. අවංක වූවෙහිය. ඒ නිසා මම ඔබ ගැන ප්‍රසන්න වන්නෙමි" (මතෙව් 25:21) යනුවෙන් කියන සේක.

කෙසේ වෙතත් අවංක වීම මෙලොවෙහි අභියෝගයක් විය හැක්කේ අපි අවංක කම පුහුණු කරන දේවල් වලට බාධා පමුණුවමින් සහ අප කළ යුතු දෙයින් අපව වළක්වමින් යක්ෂයා ඔහුගේ උපායන් ක්‍රියාත්මක කරන්න උත්සාහ ගන්නා නිසාය. අපගේ සතුරා අප තුළ කම්මැලිකම ඇති කිරීමටත් අතපසුවීම් ඇති කරන්නත් උත්සාහ කරන බැවින් අපට ඒවා ප්‍රතික්ෂේප කිරීමට දෙවියන්වහන්සේගේ ශක්තිය අවශ්‍ය වන්නේය.

ඉතාමත් හොඳින් ඉගෙන ගැනීමට දක්ෂ මිතුරෙක් මම දැන සිටියෙමි. ඔහු සෑම විටම ඉහළ ලකුණු ලබා ගනිමින් පළමු ශ්‍රේණිය සඳහා තරඟ කළේය. කෙසේ වෙතත් 11ස් වන ශ්‍රේණියේදී ඔහුගේ මිතුරන් ඔහුට ජංගම දූරකථනයක් තෑගි කළේ ඔවුන්ට නිතරම ඔහු සමග කථා කළ හැකි වන පිණිසය. නිවසේදී දූරකථනය ඔහුට තහනම් විය. නමුත් ඔහු රහසේම තම මිතුරන්ගෙන් එය භාර ගත්තේය. ඔවුහු විභාග වේලාවලදී පවා නිතරම නිමින් විහිළු කථා පවා හුවමාරු කරගන්න පටන් ගත්හ. ක්‍රමයෙන් ඔහු පණිවුඩ හුවමාරු කිරීමට ඇබ්බැහි වූ අත දූරකථනයෙන් කාට හෝ කථා කිරීමට පටන් ගත්තේය. අවසානයේදී ඔහුගේ අවධානය බිඳී ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ ශ්‍රේණිය පහළ වැටුණු අතර ඔහු තවදුරටත් පළමු ශ්‍රේණිය සඳහා අවධානය යොමු කළේ නැත. අධ්‍යාපනය වෙනුවෙන් වරක් ඔහු තුළ තිබූ ආසාව තවදුරටත් නොවීය. ඔහු කොපමණ උත්සාහ කළත් ඔහුට නැවත අවධානය ලබා ගත නොහැකි විය.

විශේෂයෙන් දෙවියන්වහන්සේගේ දරුවන්ව යක්ෂයා පොළඹවා ගන්නේ මෙසේය. විශේෂයෙන් දෙවියන්වහන්සේගේ දරුවන්ගේ රාජකාරීවලින් ඔවුන්ව දුරස්ව තබන යම් කිසි දෙයක් ඔහු අපගේ මනසේ පැළ කරන්නේය. වෙනත් අය සාමාන්‍ය ලකුණු ලබා ගෙන ඉදිරියට ගියත් අපි ඇදහිලිවතුන් මෙන් අපට මෙලොව සහ දෙවියන්වහන්සේ යන දෙකම සමග කටයුතු කළ නොහැක. අපි ලෝකයේ දේවලට අවධානය යොමු කරන විට අපට දෙවියන්වහන්සේගේ අනුග්‍රහයද අවංක හදවත්ද කැපවීමේ ආත්මයද නැති වන්නේය. අපගේ අවධානය සහ ආශාව නැතිවී යන්නේය. එය නැවත ආපසු ලබා ගැනීම ඉතාමත් අසීරු වන්නේය. යක්ෂයා අපෙන් සොරකම් කරන්න උත්සාහ කරන්නේ මෙයයි.

එනම් අපට හොඳ නමක් ලබා දෙන යේසුස්වහන්සේ ඉදිරියෙහි අපගේ අවංක හදවත් වේ.ලෝකය ඔබ මත මහත් බරක් තබනවාක් මෙන් ඔබට දැනෙන්න පුළුවන. ඔබ පංතියේ හැසිරෙන්නේ කෙසේද, ඔබ සමාජය සමග ගනුදෙනු කරන්නේ කෙසේද, ඔබ සභාවේ සිටින්නේ කෙසේද සහ ඔබ ලබාගන්නා ශ්‍රේණි මොනවාද කියා සෑම දෙනෙක්ගේම දෙනෙත් ඔබ මත තිබෙන්න පුළුවන. ලෝකය ඉතා විමසිල්ලෙන් ඔබ දෙස බලා සිටිනවා විය හැකිය. ඒ ඔබ දරණ නාමය ඔබේම නිසා නොව ඔබ දරන්නේ යේසුස්වහන්සේගේ නාමය වන නිසාය. අපි කරන සෑම දෙයකදීම අපි උන්වහන්සේව නියෝජනය කරන හෙයින් එය අපට වැඩිපුර ආතතියක් ගෙන දෙන්නේය.එම නිසා අප මෙයත් සමග කටයුතු කරන්නේ කෙසේද? උදාහරණයකට දානියෙල් ගැන බලන්න. ඔහු වටා සිටි අය ඔහුට මහත් ආතතියක් ගෙන ආහ. ජීවත් වීම සඳහා අන් අයට වඩා අසාමාන්‍ය ලෙස සිටීමට ඔහුට සිදුවුනි.අන් අය මෙන් නොව ඔහු දෙවියන්වහන්සේව අනුගමනය කළ නිසා ඔහුට ඉතා හොඳින් සිටීමට සිදු විය. ඔවුහු බලා සිටියේ ඔහු ලිස්සන තෙක්ය. වැටෙන තෙක්ය. ඔහුගේ ප්‍රඥාව සහ ප්‍රතිචාරයන් අසමත් වන තෙක්ය. දානියෙල්ට සෑම විටම හොඳින්ම ක්‍රියා කරන්න සිදු විය. උදෑසන මධ්‍යහ්නයේ සහ රාත්‍රියේ යාච්ඤා කරමින් එසේ කිරීමට ඔහු සමත් විය. ඔහුගේ සෑම රාජකාරියකදීම නිතරම දෙවියන්වහන්සේගේ උපකාරය ඉල්ලමින් ඔහු දෙවියන්වහන්සේ සමග සම්බන්ධතාවය තබ ා ගත්තේය. සෑම කෙනෙක්ම ඔහු දෙස බලා ගෙන ඔහුව විනිශ්චය කරන හෙයින් ඔහුට මහත් හුදකලා බවක් දැණුනි. නමුත් ශක්තිය වෙනුවෙන් ඔහු දෙවියන්වහන්සේ මත යැපුය ණී. එම නිසා ඔහු කළ සෑම දෙයකින්ම ඔහුව සඵලවත් කරමින් දෙවියන්වහන්සේ දානියෙල්ට ජීවලිත හදවතක්ද මහත් ප්‍රඥාවක්ද ලබා දුන් සේක. බයිබලයේ සඳහන් වන පරිදි ඔහුට දෙවියන්වහන්සේගෙන් උත්කෘෂ්ට ආත්මයක් තිබුණි. ස්වාමීන්වහන්සේ ඉදිරියෙහිද ඔබ වටා සිටින සෑම කෙනෙක් ඉදිරියේද එවැනිම අවංක හදවතක් ඔබටත් ලබා ගත හැකිය. ඔබ උන්වහන්සේගේ නාමයට ගෞරවය දෙන විට උන්වහන්සේ ඔබගේ නාමයටත් ගෞරවය ගෙන එන සේක. එම නිසා අද දවසේ අවංක හදවතක් සහ ඔබ සමග නිතරම උන්වහන්සේගේ අභිමුඛය පවතින ලෙසටත් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.
ඉදිරි දිනවලදී දෙවියන්වහන්සේ ඔබට අවංක හදවතක් ලබා දී ඔබගේ ගෞරවය ඔසවන සේක්වා.

**යේසුස් වහන්සේ ඉදිරියෙහි අපගේ අවංක හදවත් අපට හොඳ නමක් උපයා දෙන දෙයයි**







කථාවේ හරය : අහිංසකව ජීවිතයේ දේවල් භුක්ති විඳීම වැදගත් වන අතර විය හැකි අනතුරු වළක්වා ගැනීම සඳහා නුවණ ඇතුව සිටීමද අවශ්‍ය වන්නේය.

කටපාඩම් පදය : "එහෙයින් සර්පයන් මෙන් නුවණ ඇතිව පරෙවියන් මෙන් අහිංසකව සිටපල්ලා"
(මතෙව් 10:16).

# ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍යමය ප්‍රේමයේ මහිමය



ස්ටෙලා දිනකරන් සහෝදරිය

සෑම ආකාරයකම ප්‍රේමය අතර ඉතාම උසස් සහ මහිමාන්විත ප්‍රේමය වන්නේ දෙවියන්ගෙත් දෙවියන්වහන්සේගෙන් නික්මෙන "දිව්‍යමය ප්‍රේමයයි". බයිබලයේ සඳහන් වන්නේ "දෙවියන්වහන්සේ ප්‍රේමයය" (1 යොහන් 4:8) යනුවෙනි. ඒ අතරම තමන් තුළ ප්‍රේමයක් නොමැති ඕනෑම කෙනෙක් දෙවියන්වහන්සේව නොසළකන කෙනෙක් හැටියට සැළකිය හැකිය. මෙලොව මනුෂ්‍ය ආකාරයෙන් ස්වාමිවූ යේසුස්වහන්සේ ජීවත් වන කාලයේදී උන්වහන්සේගේ වැඩ ගැන විරුද්ධව උන්වහන්සේව ප්‍රතික්ෂේප කළ මිනිසුන්ට උන්වහන්සේ කීවේ "නුමුත් නුඹලා අඳුනමි. දෙවියන්වහන්සේ කෙරෙහි ප්‍රේමය නුඹලා තුළ නැති බව දනිමි" (යොහන් 5:42) යනුවෙනි.

එසේය. ඒ කාලයේදී උන්වහන්සේගේ "දිව්‍යමය යහපත් ක්‍රියා" දුටු පසුවත් උන්වහන්සේට කැමති නොවූ සහ සෑම විටම උන්වහන්සේගේ වැරදි සෙවූ ප්‍රේමයක් නොමැති මිනිසුන් සිටියහ. අද පවා උන්වහන්සේගේ දිව්‍යමය ස්වභාවය සහ මහිමය නොසැළකූ එවැනි මිනිසුන් සිටිති. අනෙක් අතට උන්වහන්සේගේ ප්‍රේමය ගැන තේරුම් ගෙන ඒ මගින් ආශිර්වාද ලැබූ ජනතාවක්ද සිටිති. එවැනි මනුෂ්‍යයන්ගෙන් මමත් කෙනෙක් බව කීම මට ආඩම්බරයකි. උන්වහන්සේව දැන ගැනීම පිළිබඳ දැනුම ලබාගත් අයගේ ජීවිත ඉතා මනහර ලෙස වෙනස්ව ඇති ආකාරය ගැන අපි සොයා බලමු.

**මිනිසුන් ඇද ගන්නා දිව්‍යමය ප්‍රේමය**

ස්වාමීන්වහන්සේ මෙසේ කියන සේක : ".... ප්‍රේමයේ බැඳුම්වලින්ද ඔවුන් ඇද ගතිමි" (හොෂෙයා 4:11). බයිබලයේ අපි පැහැදිළිව කියවන්නේ "මේ බාලයන්ගෙන් එක්කෙනෙක්වත් විනාශ වෙනවාට ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ කැමති නොවන සේක" (මතෙව් 18:14) සහ "සියලු මනුෂ්‍යයන් ගළවනු ලැබ සැබෑව දැන ගැනීමට පැමිණෙනවාට කැමති වූ...." උන්වහන්සේ (1 තිමෝති 2:4) යනුවෙනි.

කෙසේ වෙතත්, ඔහුගේ හදවත තද කර ගෙන මනුෂ්‍යයාට උන්වහන්සේගේ ප්‍රේමයේ ජීවත් වන්න අවශ්‍ය නොවේ. නමුත් ඔහු සාතන්ගේ වහලෙක් වී ලෝකයේ තෘෂ්ණාවට ගොදුරු වී විනාශයේ පුතෙක්/දුවෙක් වෙමින් තම ජීවිතය විනාශ කර ගන්නේය. දෙවියන්වහන්සේ පළමුවෙන්ම මැවූ සහ ඒදන් උයනේ ආශිර්වාදිත ජීවිතයක් ගත කළ ආදම් සහ ඒවගේ ජීවිත ගැන බයිබලයේ සඳහන් වේ. දිවා භාගයේ සිසිල් වේලේ ඇවිදිමින් සිටි දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් වටවී තිබුණු ඔවුන්ගේ මහිමවත් ජීවිත යක්ෂයාගේ වචනයට කීකරු වී ඔවුන් නැති කර ගත්තේ පලතුරක් වෙනුවෙනි. ඔවුන් දෙවියන්වහන්සේගේ ප්‍රේමය ප්‍රතික්ෂේප කිරීම නිසා ඔවුන්ගේ ජීවිතයේ අවසානය කෙතරම් සෝචනීයද! දෙවියන්වහන්සේ විසින් මහත් ප්‍රේමයෙන් ඔවුන් වෙනුවෙන් සැළසුම් කර තිබූ සියලුම ආශිර්වාදයන් නැති කර ගත්හ. එසේම භයානක සහ වේදනාකර ජීවිතයක් ගත කිරීමට ඔවුන්ට සිදු විය (උත්පත්ති 3:23).

ප්‍රිය ස්නේහ්වන්තයිනි, දෙවියන්වහන්සේ විසින් ඔබගේ ජීවිතයටත් ප්‍රේමයෙන් සකස් කරන ලද "ගැළවීම" යන අසමසම ආශිර්වාදයක් සුදානම් කර තිබේ. ගැළවීම යනු පාප, සාප සහ අධර්මිෂ්ඨකම යනාදියෙන් දෙවියන්වහන්සේ විසින් ඔබව ගළවා ගෙන ලෝකයාට ඔබට ලබා දිය නොහැකි සමාදානය සහ ප්‍රීතිය යන දිව්‍යමය ආශිර්වාද වලින් ඔබව පිරවීම වන්නේය. උන්වහන්සේගේ දිව්‍යමය ප්‍රේමයෙන් අපට මහිමවත් ජීවිතයක් ලබා දීම දෙවියන්වහන්සේගේ කැමැත්ත වන සේක. මේ ගැන බයිබලයෙන් බොහෝ නිදසුන් ලබා ගත හැකිය. යොහන් 4 පරිච්ඡේදයේදී භයානක ලෞකික ජීවිතයක් ගත කළ කාන්තාවකගේ ජීවිතය ශුද්ධවූ සහ දිව්‍යමය එකක් බවට වෙනස් වීම ගැන අපි කියවන්නෙමු.

මාංසයේ තෘෂ්ණාවෙන් ගැඹුරටම ගොස් සිටි ඒ සමරිතානු කාන්තාවගේ අඳුරු ජීවිතය උන්වහන්සේගේ දිව්‍යමය සහ ප්‍රේමණීය වචනවලින් ස්වාමිවූ යේසුස්වහන්සේ වෙනස් කර ඇයව ඉවැන්ජලිස්තවරියක් කළ සේක. ඇය බොහෝ දෙනෙක් උන්වහන්සේ වෙතට ගෙන ආ අතර ඔවුන් සමග උන්වහන්සේ ගැන බෙදා ගත්තාය. උන්වහන්සේගේ දිව්‍යමය ප්‍රේමය කෙතරම් මහත්ද. කෙතරම් මහිමාන්විතද. ඒ ආකාරයටම ප්‍රේමණීය ස්වාමීන්වහන්සේට වෛර කරමින් විනාශයේ පුත්‍රයෙක් ලෙස අඳුරේ ජීවත් වූ සාවුල් උන්වහන්සේගේ ප්‍රේමයේ ස්පර්ශය ලැබ ඔහුගේ අඳුරු ජීවිතය උඩු යටිකුරු කරමින් දිව්‍යමය ආලෝකයේ ජීවිතයකට වෙනස් වුනි. ඔහුගේ වචන අපි විශ්ලේෂණය කර බලමු.

"මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි. එසේවී නුමුත් මම ජීවත් වෙමි. නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත් වන සේක. තවද මා දැන් මාංසයෙහි ජීවත් වන ජීවිතය මට ප්‍රේම කළාවූ මා උදෙසා තමන්ව පාවා දුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි " (ගලාති 2:20). එසේය.

ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ පූජාව තුළින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය සෑම මනුෂ්‍යයෙක්ගේම ජීවිතවලට මහත් වෙනසක් ගෙන ඒම දෙවියන්වහන්සේගේ දිව්‍යමය කැමැත්ත වන සේක.

එසේම ඔවුන් උන්වහන්සේගේ ප්‍රේමයෙන් පිරී සහ ඒ මහිමය නොදත් අයවළුන්ට එම ප්‍රේමය ප්‍රදර්ශනය කිරීමත් දෙවියන්වහන්සේගේ දිව්‍යමය කැමැත්ත වන සේක (එපීස 5:2; හෙබ්‍රෙව් 9:14).

මෙම දිව්‍යමය ප්‍රේමය මගේ ජීවිතයේ ක්‍රියා කළ ආකාරය පැහැදිළි කරන්න මට ඉඩ දෙන්න.

මම ඉපදුනෙත් හැදී වැඩුණේත් කිතුනු පවුලක වුවත් මෙම ප්‍රේමයේ මහිමය මම කිසිදා දැන නොසිටියෙමි. මගේ තරුණ කාලයේ මම හිස්වූ සහ වියලුණු ජීවිතයක් ගත කළෙමි. කෙසේ වෙතත් යථා කාලයේදී සහ උන්වහන්සේගේ මහත් කරුණාව තුළ කුරුසියේ උන්වහන්සේගේ ප්‍රේමය තේරුම් ගන්නත් සහ ඒ ප්‍රේමය මා තුළට ගලා ඒමටත් උන්වහන්සේ සැළැස්වූ සේක. අද වෙන තුරු උන්වහන්සේ වෙනුවෙන් නැගිට බැබළෙන ආශීර්වාදිත ජීවිතයක් උන්වහන්සේ මට ලබා දී තිබේ.මගේ ප්‍රිය ස්නේහවන්තයිනි, මෙම ලිපිය කියවන ඔබ මෙම ගැළවීමේ ප්‍රේමයේ උසස්කම සහ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයෙන් පිරුණු නව ජීවිතය ලබා ගෙන තිබේද? ඔබව පරීක්ෂා කර බලන්න. ස්වාමිවූ යේසුස් වහන්සේගේ ගෝලයෙක් වූ යුදස් මෙම ප්‍රේමයේ මහිමය තේරුම් නොගෙන මුදල් වලට තෘෂ්ණාවෙන් මෙම ආශීර්වාදිත දිව්‍යමය ජීවිතය නැති කර ගත්තේය. අද ඔහු වේදනාවෙන් නිරයේ සිටියි.

නිරයද එසේත් නැත්නම් ජීවනයද? ඔබගේ තේරීම කුමක්ද? භක්තියෙන් යුතුව ස්වාමීන්වහන්සේගේ පාමුල කැපවී ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය රසවිඳ උන්වහන්සේගේ ආශීර්වාද භුක්ති විඳින්න.

**සිත හා චරිතය දියුණු කරන ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය**
**(1 කොරින්ති 8:1)**

අපි කොලොස්සි 3:14 හි කියවන ආකාරයට සියල්ලට උඩින් ඇති ප්‍රේමය නැමති සම්පූර්ණකමේ බැම්ම බැඳ ගෙන සෑම දිනකම ජීවිතය භුක්ති විඳීමට ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය මග පෙන්වන්නේය. 1 තෙසලෝනික 4:9 හි අපි කියවන්නේ "..... එකිනෙකාට ප්‍රේම කරන්ට නුඹලාම දෙවියන්වහන්සේගෙන් ඉගෙන ගෙන සිටින්නහුය" යනුවෙනි.

"යෞවන වයසේ තෘෂ්ණා වලින් දුරුව පිරිසිදු සිතින් ස්වාමීන්වහන්සේට යාච්ඤා කරන්නන් සමග ධර්මිෂ්ඨකමත් ඇදහිල්ලත් ප්‍රේමයත් සමාදානයත් අනුව පලයන්න" (2 තිමෝති 2:22) යනුවෙනි.

එසේය. ඇදහිල්ලෙන්, ප්‍රේමෙන් සහ සමාදානයෙන් පිරි මෙම ධර්මිෂ්ට ජීවිතය ස්වාමීන්වහන්සේ අපට ලබා දෙන සේක. ස්වාමීන්වහන්සේගේ ප්‍රේමයෙන් අපගේ ජීවිත පිරී ගිය විට හෙබ්‍රෙව් 12:14 හි දක්වා ඇති පරිදි උන්වහන්සේම අපට මෙම ප්‍රේමය ලබා දෙන සේක : "සියල්ලන් සමග සමාදානයෙන් සිටින්ටත් ..." සළස්වා අපගේ ජීවිත භක්තිවන්ත ඒවා කරන සේක. 2 තෙසලෝනික 3:5 හි දක්වා ඇති පරිදි "ස්වාමීන්වහන්සේම නුඹලාගේ සිත් දෙවියන්වහන්සේගේ ප්‍රේමයටත් ක්‍රිස්තුස්වහන්සේගේ ඉවසීමටත් පුමුණුවන සේක්වා".

අද දවසේ අප දකින්නේ පවුලේ සාමාජිකයන් අතරේ වෛරය, තිත්තකම සහ බෙදීමය. එහි ප්‍රතිඵලය වන්නේ ප්‍රේමයට කිසිදු ඉඩක් නොමැතිව වේදනාව, දුක සහ කඳුළුය. දෙමාපියන් තම දරුවන් හදා වඩා ගැනීම සඳහා බොහෝ කැපකිරීම් කරති. නමුත් දරුවන් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය රස බලන්නේ නැතුව දෙමාපියන්ගේ ප්‍රේමය මග හැර ඔවුන්ට බොහෝ වේදනා ගෙන දෙති. මෙම දිනවල මෙවැනි දේවල් පවුල් අතර සාමාන්‍යයෙන් දක්නට ලැබේ. මෙවැනි දේවල් වෙනස් වන ලෙසටත් ජනතාවගේ සහ පවුල්වල හදවත් නිවැරදි කිරීම්වලට සහ එකිනෙකා කෙරෙහි ප්‍රේමය දැක්වීමෙන් පිරෙන ලෙසටත් භක්තියෙන් යුතුව ස්වාමීන්වහන්සේව සොයමු. මෙයට පදනම වන්නේ බයිබලය කියවීම සහ යාච්ඤාවයි. අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේ මෙයට කදිම නිදසුනකි.

යක්ෂයා උන්වහන්සේව පරීක්ෂාකරන විට උන්වහන්සේ ඔහුව දේව වචනයෙන් ජයගත් බවත් යක්ෂයා උන්වහන්සේගෙන් වෙන්ව ගිය ආකාරයත් අපි බයිබලයේ නොකියවන්නෙමුද? (මතෙව් 4:10 සහ 11).

ඒ ආකාරයටම උදෑසන පහන්වන්ටත් මත්තෙන්ද සන්ධ්‍යා කාලයේදීද සහ මුලු රාත්‍රිය පුරාමද යේසුස්වහන්සේ යාච්ඤා කරමින් අපට ආදර්ශයක් දුන් සේක.

අපි මෙය බයිබලයේ නොදකින්නෙමුද? (මතෙව් 14:23; මාර්ක් 1:35; ලූක් 6:12). ඒ අනුව ඔබත් දාවිත් මෙන් පුද්ගලිකව සහ පවුල සමග අලුයම් කාලයේ භක්තියෙන් යුතුව ස්වාමීන්වහන්සේව සෙවිය යුතු වන්නේය (ගීතාවලිය 63:1). උන්වහන්සේගේ ප්‍රේමය අපගේ පවුල් ජීවිතයේ විද්‍යාමාන වන ලෙසට පවුලක් වශයෙන් අලුයම් කාලයේ භක්තියෙන් යුතුව ස්වාමීන්වහන්සේගේ මුහුණ සෙවීමට අප උනන්දු වන්නේ නම් එය උන්වහන්සේ සමග එක්සිත් වීමට අපගේ පවුලට හැකියාව දෙන්නේය. එසේම නිරාහාර යාච්ඤාවෙ, ස්තුතිදීමේ යාච්ඤාව යනාදියෙන් වූ අපගේ යාච්ඤා ජීවිතය මගින් අපි උන්වහන්සේව භක්තියෙන් සොයන්නේ නම් අපගේ සහ අප පවුලේ හදවත් වල දිව්‍යමය එක්සත් කමටද මනසේ ඒකාග්‍රාතාවයටද ප්‍රීතියටද උන්වහන්සේ අණ කරන සේක. එසේම යක්ෂයාගේ ගුණාංගයන් වන වෛරය, බෙදීම වැනි දේවල් ප්‍රතික්ෂේප කළ හැකි දිව්‍යමය ජීවිතයක්ද අපට ලබා දෙන සේක.

ඒ ආකාරයටම උදෑසන පහන්වන්ටත් මත්තෙන්ද සන්ධ්‍යා කාලයේදීද සහ මුලු රාත්‍රිය පුරාමද යේසුස්වහන්සේ යාච්ඤා කරමින් අපට ආදර්ශයක් දුන් සේක.

අපි මෙය බයිබලයේ නොදකින්නෙමුද? (මතෙව් 14:23; මාර්ක් 1:35; ලූක් 6:12). ඒ අනුව ඔබත් දාවිත් මෙන් පුද්ගලිකව සහ පවුල සමග අලුයම් කාලයේ භක්තියෙන් යුතුව ස්වාමීන්වහන්සේව සෙවිය යුතු වන්නේය (ගීතාවලිය 63:1). උන්වහන්සේගේ ප්‍රේමය අපගේ පවුල් ජීවිතයේ විද්‍යාමාන වන ලෙසට පවුලක් වශයෙන් අලුයම් කාලයේ භක්තියෙන් යුතුව ස්වාමීන්වහන්සේගේ මුහුණ සෙවීමට අප උනන්දු වන්නේ නම් එය උන්වහන්සේ සමග එක්සිත් වීමට අපගේ පවුලට හැකියාව දෙන්නේය. එසේම නිරාහාර යාච්ඤාවෙ, ස්තුතිදීමේ යාච්ඤාව යනාදියෙන් වූ අපගේ යාච්ඤා ජීවිතය මගින් අපි උන්වහන්සේව භක්තියෙන් සොයන්නේ නම් අපගේ සහ අප පවුලේ හදවත් වල දිව්‍යමය එක්සත් කමටද මනසේ ඒකාග්‍රාතාවයටද ප්‍රීතියටද උන්වහන්සේ අණ කරන සේක. එසේම යක්ෂයාගේ ගුණාංගයන් වන වෛරය, බෙදීම වැනි දේවල් ප්‍රතික්ෂේප කළ හැකි දිව්‍යමය ජීවිතයක්ද අපට ලබා දෙන සේක.

මගේ ජීවිතයේ මම උන්වහන්සේ වෙනුවෙන් භක්තිවන්ත ජීවිතයක් ගත කරන විට කිසිම හේතුවක් නොමැතිව මගේ පවුලේ අය මාව පවුලෙන් කොන් කළ අතර මම හුදකලා ජීවිතයක් ගත කළෙමි. කෙසේ වෙතත් ඔවුන් එකිනෙකා වෙත උන්වහන්සේගේ ප්‍රේමය මා තුළින් ගලා යෑමට උන්වහන්සේ සැළැස්වූ සේක. එහි ප්‍රතිඵලයක් වශයෙන් මට වෛර කළ ඔවුන් වෙතට මා තුළ තිබූ දිව්‍යමය ප්‍රේමය ඔවුන්ට පෙණුනි. අවසානයේ කුමක් සිදුවන්න ඇත්දැයි ඔබ සිතන්නේද? ඒ සෑම කෙනෙක්ගේම හදවත් ස්වාමීන්වහන්සේ උඩු යටිකුරු කර වෙනස් කළ සේක. දෙවියන්වහන්සේගේ සමාදානය අපගේ පවුල් තුළ රජකම් කළේය. සෑම කෙනෙක් උන්වහන්සේගේ ප්‍රේමය රස විඳින දිව්‍යමය ජීවිතය ලබා ගත්හ. ඔවුන් ඉදිරියේ නොවැදගත් වූ මගේ ජීවිතය උන්වහන්සේ නිසා ගෞරවනීය එකක් ලෙසට වෙනස් විය. මා ගැන තිත්තකමක් තිබූ සෑම කෙනෙක් ඉදිරියේම ස්වාමීන්වහන්සේ මාව එසෙවූ අතර මම ගෞරවයේ භාජනයක් ලෙසට වෙනස් වූයෙමි. ස්නේහවන්තය, ඔබත් දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් පිරිය යුතු වන්නේය. එය ඔබට මග පෙන්වා ඔබව නිවැරදිකර මෙම ලෝකයේදීම ඔබට ආශීර්වාදිත සහ මහිමාන්විත ජීවිතයක් ලබා ගැනීමට උපකාර වනවා ඇත.

**අපට ප්‍රේම කළාවූ උන්වහන්සේ කරණකොට ගෙන අප ජය ගන්නෝ වෙමු (රෝම 8:37)**

බයිබලයේ මෙසේ සඳහන් වේ :

"නුමුත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොට ගෙන අපට ජය දෙන්නාවූ . දෙවියන්වහන්සේට ස්තුති වේවා" (1 කොරින්ති 15:57)

"ලෝකයෙන් ජය ගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය" (1 යොහන් 5:4).

"නුඹලා වනාහි නුඹලාගේ ඉතා ශුද්ධ ඇදහිල්ල පිට නුඹලාම ගොඩනගා ගනිමින් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සිට යාච්ඤා කරමින්....." (යුද් 20).

"ලෝකයෙන් ජය ගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය" (1 යොහන් 5:4).

"නුඹලා වනාහි නුඹලාගේ ඉතා ශුද්ධ ඇදහිල්ල පිට නුඹලාම ගොඩනගා ගනිමින් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සිට යාච්ඤා කරමින්....." (යුද් 20).

අපි කොලොස්සි 2:6 සහ 7 පරෙස්සමින් කියවා එය අනුගමනය කරන්න උනන්දු වන්නේ නම් අපට ඒකාන්තයෙන්ම මෙම ආශීර්වාදය ලබා ගත හැකිය. පළමුකොටම උන්වහන්සේගේ අනුග්‍රහය මගින් උන්වහන්සේ තුළ මුල් බැස ගොඩනැගී ඇති ක්‍රිස්තියානි ජීවිතයක් උන්වහන්සේ ඒකාන්තයෙන්ම ලබා දෙන සේක. ඉන්පසුව ක්‍රිස්තුස්වහන්සේ තුළ නොසෙල්වෙන ස්ථිරවූ ඇදහිල්ලක් ඇති දිව්‍යමය මාර්ගයේ උන්වහන්සේ ඔබව ගෙන යන සේක.

"ඔබට උගන්වන්නෙමි. ඔබ විසින් යා යුතු මාර්ගයෙහි නුඹට ගුරුකම් දෙන්නෙමි. මාගේ ඇස නුඹ කෙරෙහි යොමු කොට නුඹට දැනමිතිකම් දෙන්නෙමි" (ගීතාවලිය 32:8).



2024 සීෂා ව්‍යාපෘතියේ තවත් සමාජ මෙහෙවරයන් කිහිපයක්ම දියත් කිරීමට දෙවිදුන්ගේ කරුණාව ලැබුණි. ඉන් එක් මෙහෙවරක් වශයෙන් මහා මාර්ගය පිරිසිදු කරන්නන් හට දිවා ආහාර වේලක් ලබා දී ඔවුන් හට යාච්ඤාවෙන් සහ ශුභාරංචිය ඔවුන්ගේ හදවත් සුවපත් කලේ.





තවත් එක් මෙහෙවරක් වශයෙන් හපුතලේ, මන්නාරම, යාපනයේ ප්‍රදේශ කිහිපයක්, ගම්පොළ, මඩකලපුව යන ප්‍රදේශයන් හී පාසල් ළමුන් සදහා රු. 1500 ක් වටිනා පාසල් බෑග් ලබා දෙන ලදියි. ඒ සමගම ඔවුන් හට ජීවත් වීමට ආදර්ශමත් අවවාදයන් කිහිපයක් ලබා දී දෙවිදුන්ගේ ප්‍රේමයේ පණිවිඩයද ඔවුන් සමග බෙදා ගන්නා ලදියි.





මෙවරත් පාසල් ළමුන් දහසක් සදහා රු. 1500.00 ක් වටිනා පාසල් බෑග් ලබා දීමට සැලසුම් කර ඇත. ඒ සදහා උපකාර කිරීමට ඔබත් කැමති නම් අපගේ ගිණුම වෙත ඔබගේ මුදල් බැර කරන්න. ඔබ තැම්පත් කළ මුදලෙහි රිසිට් පත අපගේ වට්ස්සප් ගිණුම වෙත යොමු කරන්න.

WhatsApp-0777617350



**8106022516**
**Jesus Calls International**
**Commercial Bank,**
**Bambalapitiya.**







# ශුභාරංචි රැස්වීම්





## මහනුවර

දෙවියන් වහන්සේගේ මහත් කරුණාවෙන් යුතුව මහනුවර ප්‍රදේශයේ ජනයන්ට දේව ශුභාරංචිය ලබා දෙමින් ආත්ම දිනා ගන්නා පිණිස එක් දින ශුභාරංචි රැස්වීමක් පැවැත් වූ අතර විශාල සෙනගක් දෙවියන් වහන්සේගේ සුවයද මිදීමද ස්පර්ශයද ලබා ගත්තෝය

## කුරුණෑගල

දෙවියන් වහන්සේගේ මහත් කරුණාවෙන් යුතුව කුරුණෑගල ප්‍රදේශයේ වාසය කරන ජනයන්ට දෙවියන් වහන්සේගේ ශුභාරංචිය ලබා දෙමින් ආත්ම දිනා ගන්නා පිණිස එක් දින ශුභාරංචිය රැස්වීමක් පැවැත් වූ අතර ඊට විශාල පිරිසක් සහභාගි වී දෙවියන් වහන්සේගේ සුවයද මිදීමද ස්පර්ශයද ලබා ගත්තේය





turn SRI LANKA

සතියක් හැර සතියක් සෑම බ්‍රහස්පතින්දා දිනකම පස්වරු 6ට තරුණයන් උදෙසා පවත්වනු ලබන විශේෂ වැඩසටහන අපගේ YOUTUBE , FACEBOOK යන අපගේ නිල නාලිකාවන්හී විකාශය වේ.

**JESUS CALLS SRI LANKA ONLINE**

බම්බලපිටිය යාච්ඤා කුළුණේදී සෑම බදාදා දිනක උදෑසන 10.00 දේශය උදෙසා නිරාහාර යාච්ඤාව ද
සෑම සිකුරාදා දිනකම සවස 5.30 සුව කිරීමේ දේව මෙහෙයද පැවැවේ.



පැය 24 යාච්ඤා සේවාවන් ලබා ගැනීමට අමතන්න:
011 44 88 111 /011 2 555 401
බම්බලපිටිය යාච්ඤා කුළුණ- 15/1 බී ජෝස්ප් පටුමග බම්බලපිටිය, කොළඹ 04. දුරකථන අංකය : 011 44 88 112
මට්ටක්කුලිය යාච්ඤා කුළුණ - 65/373, 5 වන පටුමග, කාක දූපත, කොළඹ 15. දුරකථන අංකය : 011 25 21 112
යාපනය යාච්ඤා කුළුණ - 32,පරණ උයන් පාර, චුන්ඩිකුලි. දුරකථන අංකය : 021 221 27 37
Email : admin@jesuscalls.lk